# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,247 — 1964 දෙසැම්බර් 4 වැනි සිකුරාද — 1964.12.4

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1769 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 1800 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1780 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1781 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 1798 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම්... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 1800 | විවිධ දැන්වීම් ... ... ... ... | — |


## තනතුරු ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පල කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදළවන පොදු කොන්දේසි

**දීමනා.**—ජීවන කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා

## විශේෂ නිවේදනයයි

1964 දෙසැම්බර් 25 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින් 1964 දෙසැම්බර් 24 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1964 දෙසැම්බර් 19 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1964 දෙසැම්බර් 4 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

වලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය තෙක් වර්ග කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලසීමා ඇතුළත සමත් වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත්, ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා තැබීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

**සංලක්ෂ්‍යය.**—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීමේ නියමයෙන් නිදහස් වෙති.

(vi) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් වීමටද ඔවුන්ට නියම වනු ඇත.

(5) **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම. අඩුම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සාමාර්ථ්‍යය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාළ නොවන්නේ ය).

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**— මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නා වූ ද, මහා රැජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහාජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට (සිය නොමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුටමද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. තව ද, තමන්ගේ ඉල්ලුම් පත්‍රයේ දෙවන පිටපතක් ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර ලැබෙන සේ එම නිලධාරියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින්ම යැවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිල වලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන් දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට ඍජු බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8 **සදාසකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය**—සදාසකම් ලැබීම සඳහා වැටුප යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

අංක : ඒ. 309/එක්ස්. 1518/64.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මහරගම ගුරු විද්‍යාලයේ සාමාන්‍ය විෂයයන් පිළිබඳ කථිකාචාර්ය තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවමින් අංක 14,230 හා 1964 නොවැම්බර් මස 20 වැනි දින දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දැන්වීමට අමතර වශයෙනි. එම තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර භාරගන්නා දිනයන් පහත සඳහන් පරිදි දීර්ඝ කරන්නට යෙදුන බව මෙයින් නිවේදනය කෙරේ.

මෙරට ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසානය දිනය : 1964.12.11.
පිටරට ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය : 1964.12.18.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 නොවැම්බර් මස 30 වැනිදා,
කොළඹ 1, ගාළු මුවදොර
මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

12-263/1—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒ. 157/එක්ස්. 1521/64.

## ජාතික ක්‍රම සම්පාදක දෙපාර්තමේන්තුව

### පර්යේෂණ නිලධාරි තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවමින් අංක 14,211 හා 1964 ඔක්තෝබර් මස 30 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කළ අංක ඒ. 157/එක්ස්. 1521/64 හා 1964 ඔක්තෝබර් මස 26 වැනි දින දරණ දැන්වීම සම්බන්ධයෙන් එම තනතුරු සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය පහත සඳහන් පරිදි දීර්ඝ කර ඇති බව සාමාන්‍ය දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ඉල්ලුම් පත් : 1964 දෙසැම්බර් මස 18 වැනි දින.
(ආ) විදේශීය ඉල්ලුම් පත් : 1964 දෙසැම්බර් මස 24 වැනි දින.

සී. ජේ. විජේසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය,
තැ. පෙ. අංක 500.

12-263/2—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

4. අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්. සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) තමා යාන්ත්‍රික ඉංජිනේරු ආයාතනයේ සහචර සාමාජිකත්වයක් දරන්නකු බව :

(ආ) වගකිව යුතු තත්ත්වයක් දරමින් විශාල ඉංජිනේරු ආයතනයක ඉංජිනේරු ශ්‍රේණියේ යටත් පිරිසෙයින් අවුරුදු දහයකවත් පළපුරුද්දක් ඇත්තකු බව ;

(ඉ) 1964 දෙසැම්බර් මස 18 වැනි දිනට වයසින් අවුරුදු 45කට නොවැඩි බව (දැනටමත් ලංකාණ්ඩුව යටතේ රජයේ සේවයේ සිටින නිලධාරීන්ට මෙම වගන්තිය අදාල නොවේ).

5. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම හෝ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි විට අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත :—

(අ) උප්පැන්න සහතික පත්‍රය

(ආ) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් වෙනුවෙන් සහතිකපත්

(ඉ) අපේක්ෂකයාගේ සුදුසුකම්, චරිතය හා පත්වීමට යෝග්‍යතාවයට අදාල මෑතකදී ලබාගත් සහතික තුනක් (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන් විසින් මෙම වගන්තිය යටතේ සහතිකපත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ).

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත් ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම්පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

සංලක්ෂ්‍යය :

(1) අයදුම්පත්‍රයට ලියවිලි හෝ ලියවිලිවල පිටපත් හෝ නොඇමිණිය යුතුයි.

(2) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

7. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍යසේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත විනා මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම්වලට අදාල වන පොදු කොන්දේසි වෙතද අවධානය යොමු කරවමි.

9. අයදුම්පත් සියල්ලම ලැබුණ බැව් දන්වනු ඇත. අයදුම්පත් භාර ගන්නා අවසාන දින සිට දින 7ක් ඇතුලත, තම අයදුම්පත ලැබුණ බැව් දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවෙක් වේනම් ඔහු විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත දැනුම් දිය යුතුයි. කිසියම් අයදුම්කරුවකු විසින් මේ අවශ්‍යතාවය පැහැර හරින ලදහොත් තම අයදුම්පත සලකා බැලීම සඳහා ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 නොවැම්බර් මස 30 වෙනි දින,
කොළඹ 1, ගාලුමුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායඹාලයේ දී ය,
තැ. පෙ. 500.

11-260/2—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒ 379/එක්ස් 1528/64.

## කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීම පිළිබඳ දෙපාර්තමේනතුවේ වාණිජ විද්‍යාව පිළිබඳ සහකාර කථිකාචාර්ය තනතුර

කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීම පිළිබඳ දෙපාර්තමේන්තුවේ වාණිජ විද්‍යාව පිළිබඳ සහකාර කථිකාචාර්ය තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කායඹාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන් හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(අ) මෙරට අයදුම් පත්‍ර—1964 දෙසැම්බර් මස 18 වෙනිදා.

(ආ) විදේශීය අයදුම් පත්‍ර—1964 දෙසැම්බර් මස 24 වැනිදා.

සටහන් : (i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුයි.

(ii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කායඹාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්න හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කායඹාලයට නියමිත කාල සීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට අදාළ වැටුප් ක්‍රමය මෙසේ ය :—වර්‍ෂයකට රුපියල් 5,160—360 × 9—8,400 දක්වා.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1964.12.18 වන දිනට වයස අවුරුදු 23 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි විය යුතුයි. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට ඉහල වයස් සීමාව අදාළ නොවේ).

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ වාණිජ හෝ අර්ථ ශාස්ත්‍රය පිළිබඳ විශේෂයෙන් වාණිජය පිළිබඳ 1 වැනි පෙළ හෝ 2 වැනි පෙළ උපාධියක් තිබීම.

සටහන : (i) විශ්ව විද්‍යාල මට්ටමේ ඉගැන්වීමේ පළපුරුදු සහ/හෝ ගණක ශාස්ත්‍ර පිළිබඳ ප්‍රායෝගික පළපුරුදු ඇති අයට විශේෂ සැලකිලි දක්වනු ලැබේ.

(ii) කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීම පිළිබඳ දෙපාර්තමේන්තුවේ උපදේශකයන් වන අයට වාණිජය හෝ අර්ථ ශාස්ත්‍රය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ උපාධියක් ඇත්තේ නම් (ඇ) උපඡේදය යටතේ යොදා ඇති සුදුසුකම් නැත්තේ වුව ද ඉල්ලුම් කරුවන් විය හැකිය.

(ඈ) සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් තිබීම හෝ අවුරුදු 3ක් ඇතුළත දී සිංහලෙන් ඉගැන්වීමට හැකියාවක් ලබා ගැනීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි අපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නො ලැබේ).

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචායර්වරයාගෙන් විය යුතුය.

(ඉ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඊ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

සැ.යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම් පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡෙදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව දන්වනු ඇත. සත් දිනක් ඇතුලත තම අයදුම්පත ලැබුන බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවකු වෙත් නම් වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 නොවැම්බර් මස 30 දින,
කොළඹ 1, ගාලුමුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දීය.
තැපැල් පෙට්ටිය 500.

12–260/3—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සේවක මණ්ඩලයේ පුරප්පාඩුව ඇති භෝජනාගාර සේවක තනතුරු දෙකක් හා සුඹ කරන්නකුගේ තනතුරක් සඳහා අයැදුම් පත් කැඳවනු ලැබේ.

2. මෙම තනතුරුවලට අදාල වැටුප් පරිමාණය මෙසේය:—

රුපියල් 600—30×8 හා රුපියල් 24×1—රු. 864.

ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවල් කුලී, ජීවනාධාර හා විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ.

3. අයැදුම්කරුවන්—

(අ) ලංකාවේ පුරවැසියන් විය යුතුයි;

(ආ) වයසින් අවුරුදු 21ට නොඅඩු අවුරුදු 35ට නොවැඩි අය විය යුතුයි;

(ඉ) සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් අඩුම වශයෙන් 7 වැනි ප්‍රමාණය තෙක් ඉගෙනුම ලබා ඇති අය විය යුතුය.

4. රාජ්‍ය සේවයේ නියුක්ත අයැදුම්කරුවන් තම අයැදුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එම අයැදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයැදුම්කරුවන්, පත් කිරීම සඳහා තෝරා ගනු ලැබුවහොත්, ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට හැකිවේද, නැද්ද, යන වග, අංක 109 දරණ පාලන රෙගුලාසියට අනුකූලව ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සඳහන් කළ යුතුයි.

5. සහතික පත්‍ර ආදියෙහි පිටපත් පමණක් (මුල් ලියවිලි නොවේ) මේ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුවේ. අයැදුම්පත් 1964 දෙසැම්බර් මස 26 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි.

6. අයැදුම් පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

එස්. එස්. විජේසිංහ,
නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්.

කොළඹ, 1964 නොවැම්බර් මස 27 වැනි දින දීය.

12–195—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සේවක මණ්ඩලයේ පුරප්පාඩුව ඇති 2 වැනි ශ්‍රේණියේ ලිපිකාර තනතුරු දෙකක් සඳහා ලංකාවේ පුරවැසියන්ගෙන් අයැදුම් පත් කැඳවනු ලැබේ.

2. මෙම තනතුරුවලට අදාල වැටුප් පරිමාණය මෙසේය:—

රුපියල් 1,680—120—රු. 4,320.

ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවල් කුලී, ජීවනාධාර හා විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ.

3. අයැදුම්කරුවන් වයසින් අවුරුදු 18ට නොඅඩු අවුරුදු 35ට නොවැඩි අය විය යුතුයි. සාමාන්‍ය ලිපිකරු සේවයේ හා ඊට සමාන අනිකුත් ලිපිකාර සේවාවන්හි සාමාජිකයන් තම අයැදුම් පත් එවිය යුත්තේ ඔවුන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගේ මාර්ගයෙනි. එම අයැදුම් පත් ඉදිරිපත් කිරීමේදී අයැදුම්කරුවන් පත් කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත්, ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට හැකිවේද, නැද්ද, යන වග, අංක 109 දරණ පාලන රෙගුලාසියට අනුකූලව ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සඳහන් කළ යුතුයි.

4. රජයේ සේවයේ නියුක්ත නොවන අයැදුම්කරුවන් අඩුම වශයෙන් උසස් පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වූ අය විය යුතුයි.

5. මෙම ඇබෑර්තු—

(අ) සිංහල ඉංග්‍රීසියටත් හා ඉංග්‍රීසි සිංහලටත් පරිවර්තනය කිරීමට හැකියාව ඇති සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් ටයිප් ගැසීමට දන්නාවූ ලිපිකරුවකුගේ තනතුරක්; සහ

(ආ) දෙමළ ඉංග්‍රීසියටත් හා ඉංග්‍රීසි දෙමළටත් පරිවර්තනය කිරීමට හැකියාව ඇති දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් ටයිප් ගැසීමට දන්නාවූත් ලිපිකරුවකුගේ තනතුරක්;

සඳහා වේ. මෙම තනතුරුවලින් කවර තනතුරක් සඳහා අයැදුම්කරු ඉදිරිපත් වන්නේදැයි අයැදුම් පතෙහි සඳහන් කළ යුතුයි.

6. සහතික පත්‍ර ආදියෙහි පිටපත් පමණක් (මුල් ලියවිලි නොවේ) මේ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුවේ. අයැදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ. අයැදුම් පත් 1964 දෙසැම්බර් මස 26 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි.

එස්. එස්. විජේසිංහ,
නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්.

කොළඹ, 1964 නොවැම්බර් මස 27 වනදා.

12–196—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### 2 වැනි ශ්‍රේණියේ කාර්මික සහකාර තනතුර

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා අධ්‍යාපන ශාඛාවේ දෙවන ශ්‍රේණියේ කාර්මික සහකාර තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ පහත දක්වන ආකෘතිපත්‍රයේ පිළියෙළ කළයුතු ඉල්ලුම්පත්, කොළඹ, තැ. පෙ. 509, වන සංරක්ෂක වෙත 1964 දෙසැම්බර් 19 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 1,860—16×120—රු. 3,780 කි. (රු. 3,080 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සමගය).

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනතේ උපලේඛනයට තනතුර ඇතුළු කරනු ලැබුවහොත් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්:** සෑම අයදුම්කරුවෙක්ම—

(අ) 1964 දෙසැම්බර් මස 19 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 25 ට නොවැඩි බවද (අන් අයුරින් සුදුසුකම් ඇති රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් වෙනුවෙන් මේ වයස් සීමාවක් බල නොපායි.);

(ආ) යටත් පිරිසෙයින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන උසස් විභාගයක් උසස් ගණිතය හා භෞතික විද්‍යාව සමග සමර්ථ වී ඇති බව (ව්‍යවහාරික ගණිතයෙන් හා රසායන විද්‍යාවෙන් සමත් වී ඇත්නම්, විශේෂයෙන් සලකා බලනු ඇත.) හෝ උසස් ගණිතය හා භෞතික විද්‍යාව ඇතුලුව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් සමර්ථවී ඇති බව හා ලංකා කාර්මික විද්‍යාලයයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතික පත්‍රය (විද්‍යුත හා යාන්ත්‍රික) හෝ (සිවිල්) දරන බවද;

(ඇ) විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුතු බවද, සතුටුදායක ලෙස ඔප්පු කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් පහත දක්වන ලිපි ලේඛනවල පිටපත් (මුල් ලිපි නොවේ) සිය ඉල්ලුම්පත් වලට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (බෞතීස්ම සහතිකය හෝ උප කෘත පාඨශාලාවල රෙගුලාසි මාලාව වෙනුවෙන් නිකුත් කළ සහතික පත් බාරගනු නොලැබේ.) ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතික පත්‍රය ;

(ඇ) අයදුම්කරුගේ චරිතය හා තනතුරට පත්වීමට ඇති යෝග්‍ය තාවය පිළිබඳව ළඟදී ලබාගත් සහතික පත් තුනක් (දැනට මත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් එවැනි සහතික පත් අනවශ්‍යය.)

6. මේ ගැසට් පත්‍රයේ පළමුවන භාගයේ දෙවන ඡේදයේ ආරම්භ යේ දක්වා ඇති. රජයේ සේවයේ පත්වීම් වලට බලපාන සාමාන්‍ය කොන්දේසි බලන්න.

7. නියමිත දිනයෙන් පසුව මේ කාර්යාලයට ලැබෙන ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

8. ඉල්ලුම්පත් හෝ තනතුර පිළිබඳ අනිකුත් ලිපි ඇත්නම් ඒවා වන සංරක්ෂකට මිස මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුට පෞද්ගලිකව එවිය යුතු නොවේ.

ම. තමසිවායම්,
වැඩ බලන වන සංරක්ෂක.

1964 නොවැම්බර් මස 24 දින,
කොළඹ 2, තැ. පෙ. 509,
වන සංරක්ෂකගේ කාර්යාලයේ දීය.

## ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිළි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. ලාංකිකයෙකු වනුයේ පරම්පරාවෙන්ද ලියා පදිංචි කිරීමෙන්ද යන වග :————.

4. (අ) උපන් දිනය :————.
   (ආ) 64.12.19 වන දිනට වයස :——. අවුරුදු :——, මාස :——.

5. දැනට තනතුරක් දරන්නේ නම් ඒ කුමක්ද :————.

6. උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.

7. කලින් රැකියාවන්හි යෙදී සිටියේ නම් විස්තර :————.

8. විශේෂ සුදුසුකම් ඇත්නම් ඒවා දන්වන්න :————.

————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12 36—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### රජයේ ගුරු විද්‍යාලයන්හි නැටුම් උපදේශක (පිරිමි) තනතුර

රජයේ ගුරු විද්‍යාලයන්හි නැටුම් උපදේශක තනතුරක් සඳහා 1964 දෙසැම්බර් මස 24 වැනි දින හෝ එම දිනට පෙර කොම්පඤ්ඤ වීදියේ, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගු. වි. ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වරයා විසින් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—මේ තනතුර සඳහා නියමිත වාර්ෂික වැටුප් ක්‍රම පහත දැක්වේ :—

| | |
|---|---|
| (අ) විශ්ව විද්‍යාලයයේ හෝ ඉන්දියාවේ පිළිගත් ආයතනයක පෙරදිග නැටුම් පිළිබඳ උපාධිය හෝ සහතික පත්‍රය දරන්නන්ට සහ ලංකා රජයේ ලලිත කලායතනයේ 6 වසක නැටුම් පිළිබඳ සාමාන්‍ය පාඨමාලාව අනුගමනය කොට සාර්ථක ලෙස නිම කරනු ලැබුවන්ට | රු. 1,920—72—120— රු. 3,240 |
| (ආ) ගාන්ධර්ව සභාවේ අවසාන සහතික පත්‍රය හෝ ලංකා රජයේ ලලිත කලා ආයතනයේ පෙර දිග නැටුම් පිළිබඳ මධ්‍යම සහතික පත්‍රය (සිවු වසක පාඨමාලාව) හෝ විශ්ව විද්‍යාලයක හෝ පිළිගත් වෙනයම් ආයතනයක පෙරදිග නැටුම් පිළිබඳ ඩිප්ලෝමා උපාධියකට පියවරක් වූ මධ්‍යම සහතික පත්‍රයක් දරන්නන්ට | රු. 1,344—72—රු. 2,568. |
| (ඇ) (අ) හෝ (ආ) උපඡේදයන්හි සඳහන් සුදුසුකම් නොමැති වුවද නැටුම් පිළිබඳ දස වර්ෂයක පළපුරුද දෙන් ලත් අත්දැකීම ඇතිව සහ මේ ශිල්පයේ නිපුනත්වය පිළිබඳ ප්‍රසිද්ධියක් ලද අයට | රු. 918—42— රු. 1,464. |

3. අවශ්‍ය අධ්‍යාපනික හා අනික් සුදුසුකම් :

(i) අයදුම්කරුවන් විසින් විශ්ව විද්‍යාලයක හෝ ඉන්දියාවේ පිළිගත් ආයතනයක පෙරදිග නැටුම් පිළිබඳ ඩිප්ලෝමා උපාධිය හෝ සහතික පත්‍රය ද නැතහොත් ලංකා රජයේ ලලිත කලායතනයේ 6 වසක නැටුම් පිළිබඳ සාමාන්‍ය පාඨමාලාව අනුගමනය කොට සාර්ථක ලෙස නිම කරනු ලැබ හෝ ගාන්ධර්ව සභාවේ අවසාන සහතික පත්‍රය හෝ රජයේ ලලිත කලායතනයේ නැටුම් පිළිබඳ මධ්‍යම සහතිකය හෝ පෙරදිග නැටුම් පිළිබඳ ඩිප්ලෝමා උපාධියකට පියවරක් වූ අන්කිසි මධ්‍යම සහතික පත්‍රයක් ලැබ සිටිය යුතුයි. සහතික පත්‍ර නොලැබ ඇතත් පෙරදිග නැටුම් පිළිබඳ දස වර්ෂයක පළපුරුද්දෙන් ලත් අත්දැකීම ලබා සිටින හා මෙම ශිල්පයේ නිපු නත්වය පිළිබඳව ප්‍රසිද්ධියක් ලැබ ඇති අයගෙන් ද ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

(ii) 64.12.24 වැනි දිනට ඉල්ලුම් කරුවන් වයසින් අවුරුදු 22ට අඩු හෝ 45ට වැඩි හෝ නො විය යුතුයි. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව නො යෙදේ.

4. විශේෂ කොන්දේසි :

(i) තෝරාගනු ලබන අයදුම්කරු දිවයිනේ ඕනෑම ගුරු විද්‍යාලයක සේවය කළ යුතුය. දැනට මහරගම ගුරු විද්‍යාලයයේ ඇබැර්තුවක් ඇති බැවින් සුදුසුකම් ලැබූ අයදුම්කරු මෙම ගුරු විද්‍යාලයට හෝ වෙන ගුරු විද්‍යාලයකට හෝ පත් කරනු ලැබේ ;

(ii) පහත සඳහන් කරනු ලබන ආකෘති පත්‍රයට අනුකූලව නියමිත පෝරමයෙහි ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර පෝරම මෙම කාර්යාලය මගින් සපයනු නොලැබේ. එහෙයින් දැන්වීමෙහි පළකරනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයෙන් පිටපතක් ඉල්ලුම් කරුවන් විසින් පිටපත් කරගත යුතුය. දැනට සේවය කරන සේව්‍යයා මාර්ගයෙන් ඉල්ලුම් පත් එවිය යුතුය ;

(iii) පාසැල් ගුරුවරුන්ගේ විශ්‍රාම නීති යටතේ මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගැනීමට පළමු විශ්‍රාම වැටුප් වාර්තා යටතේ ගුරු වරයෙකු වශයෙන් විශ්‍රාම සහිත තනතුරක් දරන්නෙකු පත් කරගනු ලැබුවහොත්, එම තනතුර ඔහු විසින් දරන තාක් කල්, විශ්‍රාම වැටුප් සහිතයයි ප්‍රකාශයට පමුණුවනු ලැබේ ;

(iv) ඉහත සඳහන් 2, (ඇ) ඡේදයේ සඳහන් කරනු ලැබූ වැටුප් ක්‍රමයට අනුව පත් කිරීම සඳහා අයදුම්කරුවකු තෝරා ගනු ලැබුයේ නම්, මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිතය. එවැනි අයදුම්කරුවකු විසින් ඔහුගේ වැටුපෙන් සියයට 5ක මුදලක් පොදු අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුයි.

(v) මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ පළ කර ඇති රජයේ සේවයේ තනතුරු වලට පත් කිරීම වලට අදාළ සාමාන්‍ය කොන්දේසි වෙනද අවධානය යොමු කරනු ලැබේ.

ඩී. ඇම්. හෙට්ටිආරච්චි,
අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

අංකහ: ගුවිඑ 4323, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2.
මලයි වීදිය, 1964 නොවැම්බර් මස 30 වැනි දින.

### ආදර්ශ පෝරමය

**රජයේ ගුරු විද්‍යාලයන්හී නැටුම් උපදේශක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. 1964.12.24 වැනි දිනට නිවැරදි වයස අවුරුදු:———— මාස :————. දින :————.
4. ජාතිය හා එය ලත් අන්දම :————.
5. උපන් ස්ථානය :—

 (අ) ඉල්ලුම්කරු :————.

 (ආ) ඔහුගේ පියා :————.

 (ඇ) ඔහුගේ පියාගේ පියා :————.

 (ඈ) ඔහුගේ පියාගේ පියාගේත් පියා :————.

6. අධ්‍යාපන සුදුසුකම් හා ඒවා ලබාගත් දින (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුයි) :————.
7. වෘත්තීය සුදුසුකම් :————.
8. ඉගෙනීම ලැබූ පාසැල් හා විද්‍යාල (ඇතුලත්වූ හා අස් වූ දින සඳහන් කළ යුතුයි) :————.
9. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දක්වෙන පෝරමයෙහි විස්තර සඳහන් කරන්න) :—

| පාඨශාලාවේ හෝ විද්‍යාලයයේ නම | ඇතුලත්වූ දිනය | අස් වූ දිනය | දරූ තනතුර | සේවා කාලය අ. මා. ද. | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|
| | | | | | |

මුළු ගණන :————.

10. සිංහළ භාෂාවෙන් ලබා ඇති සුදුසුකම් :————.
11. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල (සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ). ඇමිණිය යුතුය. රජයේ සේවක යන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය.)

12.. වෙනත් විස්තර :————

මවිසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින් ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව ගැනීමෙන් පසු ඒ බව දැන ගන්නට ලැබුනහොත්, කිසිම වන්දි ගෙවීමක් නොමැතිව, මා රාජකාරියෙන් පහකර දැම්මට යටත්වන බවද මම දනිමි.

————,
ඉල්ලුම් කරුගේ අත්සන.

දිනය :————.

12-162—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

**වැඩ පිළිබඳ උප පරීක්ෂක තනතුරු (තාවකාලික)**

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ වැඩ පිළිබඳ උප පරීක්ෂක තනතුරු (තාවකාලික) සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත සඳහන් ආකෘතිය අනුව සකස් කොට කොළඹ, වොරිංටන් චතුරශ්‍රයේ ප්‍රධාන මහ ජන සෞඛ්‍ය ඉංජිනේරු තැන වෙත 1964.12.15 වෙනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුය.

2. වැටුප් දීමනා සහ සේවා කොන්දේසි.—තනතුරට අදාල වැටුප රු. 1,860 න් ආරම්භව වර්ෂයකට රු. 120 බැගින් වැඩිවී රු. 3,780 දක්වා නගී. වර්ෂයකට රු. 2,820 ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි :

 (i) තනතුරු තාවකාලිකය ;

 (ii) තෝරාගත් අයදුම්කරුවෝ ඉතා කෙටි කාලයකදී රාජකාරි භාරගත යුතුය ;

 (iii) තෝරාගත් අයදුම්කරුවෝ පුරප්පාඩු ඇති වන අයුරු ස්ථිර පත්වීම් සඳහා සුදුසුකම් ලබන්නෝය.

4. අධ්‍යාපනික සුදුසුකම්.—සියලුම අයදුම්කරුවෝ පහත සඳහන් සුදුසුකම් ලබා ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

 (i) (අ) 1964.12.15 දිනට වයස අවුරුදු 21 ට නො අඩු සහ 30 ට නො වැඩි වග (මෙම දෙපාර්තමේන්තුවේ සේවකයන්ට වයස සීමාව බලපවත්වනු නො ලැබේ) ;

 (ආ) විශිෂ්ට චරිතයකින් සහ යහපත් ශරීර සෞඛ්‍යය කින් යුක්ත බව ;

 (ii) ලංකා කාර්මික විද්‍යාලයේ සිව් වසරකට නො අඩු සිවිල් ඉංජිනේරු පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති වග, හෝ

 (iii) උප පරීක්ෂකවරුන්ගේ ශ්‍රේණියට පත්වීම් ලැබීම සඳහා පැවැත්වෙන මහජන සෞඛ්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සාමාර්ථය ලබා තිබීම සහ ජල සම්පාදන ක්‍රම, විවෘත කානු ක්‍රම සහ පල්දෝරු ක්‍රම පිළිබඳව 2 වසරක පළපුරුද්දක් තිබීම, හෝ

 (iv) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් සඳහා වූ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම හෝ පහත සඳහන් විෂයයන් ඇතුළත් උසස් පාඨමාලා වක් අධ්‍යයන කර තිබීම :—

 සමීක්ෂණ 1 සහ 2 වෙනි කොටස් සහ ගොඩනැගිලි තැනීම පිළිබඳ 1 සහ 2 වෙනි කොටස් හෝ සනීපාරක්ෂක ඉංජිනේරු විද්‍යාව 1 සහ 2 වෙනි කොටස් සහ ඊට අමතරව ඉංජිනේරු විද්‍යාව සහ ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳව දෙවසරක පළපුරුද්දක් තිබීම ;

 (v) සමීක්ෂණය සහ සමතලා කිරීම පිළිබඳව සර්වේ ජනරාල් විසින් නිකුත් කරනු ලබන බලපත්‍රය ලබා තිබීම සහ ජල කර්මාන්තය සහ ගොඩනැගිලි පිළිබඳව දෙවසක පළ පුරුද්දක් තිබීම, හෝ

 (vi) අඩු වශයෙන් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම සහ විවෘත කානු ක්‍රම හෝ පල් දෝරු ක්‍රම හෝ ගොඩනැගිලි වැඩ පිළිබඳ අඩු වශයෙන්

අවුරුදු 7ක ප්‍රායෝගික පළපුරුද්දක් තිබීම සහ සමීක්ෂණය සහ සමතලා කිරීම පිළිබඳ හොඳ දැනුමක් ලබා තිබීම ;

(vii) සිවිල් හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව 5 අවුරුදු කාල පරිච්ඡේදයකට සීමිත ආධුනිකත්වයක් සම්පූර්ණ කර තිබීම හෝ ආධුනිකත්වයත් ප්‍රායෝගික පළපුරුද්දත් මුළුමනින්ම පස් වසරකට නො අඩුවන් ඊට අමතරව පූර්වෝක්ත කරුණු දෙක විෂයෙහි ගොඩනැගිලි තැනීම හෝ විශාල ඉදිකිරීම් කටයුතු සහ සමීක්ෂණ සහ සමතලා කිරීම් පිළිබඳ සිද්ධාන්තික දැනුමක් තිබීම.

**සටහන.**—(vi වෙනි සහ (vii) වෙනි ඡේදයන් යටතේ එන අපේක්ෂකයන්ට පත් කිරීමට පෙරාතුව පරීක්ෂණයකට පෙනී සිටීමට සිදුවිය හැකිවා මෙන්ම පත්වූ දින පටන් 2 වසරක් තුළ උප පරීක්ෂකවරුන්ගේ ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් ලැබීම පිණිස දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත් වීම අවශ්‍ය වනු ඇත.

5. අයදුම්කරුවෝ පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම්පතට යා කළ යුතුය :—

(i) උප්පැන්න සහතිකය ;

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය ;

(iii) කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ඇතොත් ඒවා සහ ඉංජිනේරු කර්මාන්ත පිළිබඳ පළපුරුද්ද සහ ;

(iv) ලඟදී ලබා ගත් චරිත සහතික තුනක්.

6. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වෙනි ඡේදයෙහි පළවී ඇති රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල පොදු කොන්දේසිවලට අවධානය යොමු කෙරේ.

ඩී. ඒ. ද සිල්වා,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 500,
කොළඹ 1, 1964 දෙසැම්බර් 4 වෙනි දින දීය.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**තාවකාලික වැඩ පිළිබඳ උප පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. දැන් ලිපිනය :————.
3. උපන් දිනය හා ස්ථානය :————.
4. ජාතිය :————.
5. දැනට දරණ තනතුරක් වෙයි නම් එය :————.
6. දැනට රැකියාවක් නො කරන්නේ නම් අවසාන වරට දැරූ තත්ත්වය සහ වැටුප් :————.
7. අධ්‍යාපනික සුදුසුකම් (සමත් විභාග සඳහන් කරන්න) :————.
8. කාර්මික සුදුසුකම් (සමත් විභාග සඳහන් කරන්න) :————.
9. රාජකාරිය සමග පුහුණුව, ආධුනිකත්වය ආදිය පිළිබඳ විස්තර :————.
10. ගොඩනැගිලි තැනීම, කාණු ක්‍රම, ජල සම්පාදන ක්‍රම සහ අනිකුත් ඉංජිනේරු කර්මාන්ත පිළිබඳ ලබා ඇති පළපුරුද්ද :————.
11. සුදුසුකම් ලබා ඇත්තේ කිනම් වගන්තිය යටතේද ? :————.
12. යුද්ධ හමුදා සේවයක් ඇත්නම් ඒ වකවානුව :—
13. සිංහල/දෙමළ දැනුම :————.
14. වෙනත් සුදුසුකම් :————.
15. සහතික ලබා ගත් අයවළුන්ගේ නම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12–98—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ධීවර සංස්ථාව

සංස්ථාවේ ස්ථිර සේවයේ පහත සඳහන් මාණ්ඩලික ශ්‍රේණිවලට පත්කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. සියළුම අයදුම් පත් 1964 නොවැම්බර් මස 6 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ඇති ආකෘතිය අනුව පිළියෙල කළයුතු ආකෘති පත්‍රවල වියයුතුය. අයදුම් පත් මෙම දැන්වීමේ අවශ්‍යතාවයනට හා 1964 නොවැම්බර් මස 6 දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේම පළකර ඇති සංස්ථා සේවයේ සියළුම තනතුරුවලට අදල පොදු කොන්දේසි වලටද අනුකූල වියයුතුයි. සියළුම අයදුම් පත් කොළඹ 3, ගාලු මුවදෙර, ලංකා ධීවර සංස්ථාවේ ලේකම් වෙත පහත සඳහන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළයුතුයි.

1964 දෙසැම්බර් මස 19 දින.

2. අධ්‍යක්ෂ මණ්ඩලයේ තනි අභිමතය පරිදි සුදුසු පත්වීම් ලබන්නන් ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්දට සරිලන සේ වැටුප් ක්‍රමයේ පියවරක තැබිය හැක.

3. (i) එම්. ඕ. ටී. ඉංජිනේරුවරු ii වන ශ්‍රේණිය.
මසකට රු. 1,250—50/10 ... රු. 1,750

අඩුම සුදුසුකම්: සුදුසුකම් ලැබීමෙන් පසු අවුරුදු 6ක පළපුරුද්දක් සහිත 1 වන පංතියේ එම්. ඕ. ටී. ඉංජිනේරු සුදුසුකම්

(ii) ගණකාධිකාරීන් iii වන ශ්‍රේණිය.
මසකට රු. 1,000—50/10 ... රු. 1,500

අඩුම සුදුසුකම්: වරලත් ගණකාධිකාරි වරයෙක් හෝ පිරිවැය සහ වැඩ ගණකාධිකාරි ආයතනයේ අවසාන පරීක්ෂණය සහ සුදුසුකම් ලැබීමෙන් පසු අවුරුදු 3ක පළපුරුද්දක්.
නැතහොත්,
වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හෝ, ගණකාධිකාරි මණ්ඩලයේ මධ්‍ය පරීක්ෂණය හෝ සමාන සුදුසුකමක් සහ සුදුසුකම් ලැබීමෙන් පසු අවු. 5ක පළපුරුද්දක්.

**සටහන.**—ඉහත දක්වා ඇති වැටුප් ක්‍රම තාවකාලික ඒවා වන අතර මහා භාණ්ඩාගාරයේ අනුමැතියට යටත් වේ.

4. **සාමාන්‍ය.**—කලින් ලත් පළපුරුදුකම් ඇතැයි කියාසිටින අයදුම් කරුවන් එවැනි පළපුරුදුකම් ඔප්පුවන පරිදි සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. අයදුම් කරන ශ්‍රේණිය සහ තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළයුතුයි.

ලේකම්,
ලංකා ධීවර සංස්ථාව.

ගාලු මුවදෙර,
කොළඹ 3.
1964 නොවැම්බර් මස 30 දින.

12–241—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංසථාව

### II ශ්‍රේණියේ ලිපිකරු තනතුර සඳහා ඇබෑර්තු

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ 2 ශ්‍රේණියේ ලිපිකරු ඇබෑර්තු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවීම 1964.11.27 දින දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමේ සුදුසුකම් යටතේ එන 2(ආ) ඡේදය පහත සඳහන් පරිදි වෙනස් විය යුතු බව සියලුම අපේක්ෂකයන් වෙත මෙයින් දන්වමි.

"(ආ) කාර්යාල ක්‍රම හා ලිපිකරු කටයුතු පිළිබඳ පුහුණුව ලබා ගත හැකි රජයේ දෙපාර්තමේන්තුවක හෝ රජයේ සංස්ථාවක හෝ පිළිගත් වාණිජ ආයතනයක අවුරුදු 5 කට නො අඩු පළපුරුද්දක් ලබා සිටිය යුතුයි."

ලේකම්.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංසථාව,
තැ. පෙ. 670,
242, හැව්ලොක් පාර, කොළඹ 5.

12–127—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

## පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය

පහත දැක්වෙන තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර, ලියා පදිංචි කළ තැපැලෙන්, කොළඹ 2, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවතේ, අංක 110 දරණ ස්ථානයේ පිහිටි පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලයේ සභාපති වෙත, 1964 දෙසැම්බර් 18 වෙනි සිකුරාදා සවස 4.30 ට පෙර ලැබෙන සේ එවිය යුතුය.

**1. 3 වෙනි ශ්‍රේණියේ ලිපිකාර තනතුරු**

**වැටුප් පරිමාණය.**—රු. 265—7×රු. 10—රු. 335 මූලික මාසික.

**අඩුම සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය (ඉංග්‍රීසි හෝ සිංහල) හෝ ඒ සමාන විභාගයකින් සාමර්ථය.

රජයේ හෝ වෙළෙඳ ආයතනයක ආනයන/අපනයන වැඩ පිළිබඳ අඩු වශයෙන් අවුරුදු පහක පළපුරුද්දක්, හෝ

ගිණුම් වැඩ, ලේකම් ධුරයේ කටයුතු සහ කාර්යාල පරිපාලනය පිළිබඳ අඩු වශයෙන් අවුරුදු පහක පළපුරුද්දක්.

**2. 2වෙනි ශ්‍රේණියේ ලිපිකාර තනතුරු**

**වැටුප් පරිමාණය.**—රු. 125.50—17×රු. 8.50—රු. 270 මූලික මාසික.

**අඩුම සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය (ඉංග්‍රීසි හෝ සිංහල) හෝ ඒ සමාන විභාගයකින් සාමර්ථය.

ඉංග්‍රීසි හෝ සිංහල යතුරු ලියනය ගැන හැකියාවක් අවශ්‍යය. ගබඩා, ගිණුම් හෝ වාප්පු වැඩ පිළිබඳ දැනුම විශේෂ සුදුසු කමක් වේ.

**3. උසස් ශ්‍රේණියේ ලඝුලේඛක තනතුර**

**වැටුප් පරිමාණය.**—රු. 270—1×රු. .5, 3×රු. 20, 1×රු. 25—රු. 335 මූලික මාසික.

**අඩුම සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය (ඉංග්‍රීසි හෝ සිංහල) හෝ ඒ සමාන විභාගයකින් සාමර්ථය සහ ලඝුලේඛනය පිළිබඳ උසස් වාණිජ සහතිකය හෝ ඒ සමාන විභාගයකින් සාමර්ථය.

ඉංග්‍රීසි ලඝු ගණින් ගැනීමේ වේගය මිනිත්තුවකට වචන 120ක් ඉංග්‍රීසි යතුරු ලියන වේගය මිනිත්තුවකට වචන 40ක්, ලේකම් ධුරයේ කටයුතු පිළිබඳ පළපුරුද්දක් විශේෂ සුදුසු කමක් වේ.

**4. 1 වෙනි ශ්‍රේණියේ ලඝුලේඛක තනතුර**

**වැටුප් පරිමාණය.**—රු. 87—17×රු. 6—රු. 189 මූලික මාසික.

**අඩුම සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය (ඉංග්‍රීසි හෝ සිංහල) හෝ ඒ සමාන විභාගයකින් සාමර්ථය.

ලඝු ගණින් ගැනීමේ වේගය මිනිත්තුවකට වචන 80ක් (ඉංග්‍රීසියෙන්) යතුරු ලියන වේගය මිනිත්තුවකට වචන 30 ක් (ඉංග්‍රීසියෙන්) යතුරු ලියන වේගය මිනිත්තුවකට වචන 25ක් (සිංහලෙන්).

**5. කැෂියර් තනතුර**

**වැටුප් පරිමාණය.**—රු. 75—20×රු. 6—රු. 195 මූලික මාසික.

**අඩුම සුදුසුකම්.**—කණිෂ්ඨ පාඨශාලා සහතිකය (ඉංග්‍රීසි හෝ සිංහල)

ඉංග්‍රීසි සහ සිංහල යතුරු ලියනය පිළිබඳ පළපුරුද්දක් විශේෂ සුදුසු කමක් වේ.

තෝරා ගනු ලබන තැනැත්තා විසින් මුදලින් රු. 1,000 ක සහ රක්ෂණ ඔප්පුවක් මගින් රු. ,000 ක ඇප තැබිය යුතුය.

1 ඉහත සඳහන් තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලබන අයදුම් කරුවන් සේවක අර්ථ සාධක අරමුදල් පනත අනුව ගෙවීම් කළයුතුය. ස්ථිර කිරීම් සාමාන්‍යයෙන් වර්ෂ එකකට පසුව සිදු කරනු ඇත. නමුත් අයදුම් කරුවන් රජයේ භාෂා ප්‍රතිපත්තිය අනුව ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

2. තෝරා ගනු ලබන අයදුම් කරුවන්ට රජයේ ගෙවීමේ ක්‍රමයට ජීවනාධාර දීමනා, විශේෂ ජීවනාධාර දීමනා සහ ගෙවල් කුලී දීමනා ගෙවනු ලැබේ.

ලේකම්.

පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය,
110 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 2.
1964 නොවැම්බර් 30 වෙනි දින.

12–269—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### සුබ සාධක නිලධාරි තනතුර

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ සුබ සාධක නිලධාරි තනතුර සඳහා අපේක්ෂිත සුදුසුකම් ඇති ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

වැටුප් ක්‍රමය.—රු. 400—රු. 15×5. රු. 25×9—රු. 700 (සියල්ල අඩංගු මා.සික) මෙම වැටුප් ක්‍රමය අමාත්‍යාංශයේ අනුමැතියට යටත් ය.

**සුදුසුකම් :**

(අ) වයස අවුරුදු 40 ට අඩු විය යුතුය ;

(ආ) ඉල්ලුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(i) සම්මාන 3 ක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ සමාන සහතිකයක් ලබා තිබිය යුතුය ;

(ii) කම්කරු සුබ සාධක කාර්යයන් සම්බන්ධව යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, සුබ සාධක කටයුතු පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

(iii) ක්‍රීඩා හා සාහිත්‍ය සංගම් සංවිධානය පිළිබඳ හැකියාවක් තිබිය යුතුය.

(iv) මැනවින් සිංහලෙන් කථා කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

(ඇ) රැස්වීම් සංවිධානය හා ඇමතීම. සේවක-සේව්‍ය සම්බන්ධතා ගොඩ නැගීම හා ලේඛක පළපුරුද්ද විශේෂ සුදුසුකම් වශයෙන් සලකනු ඇත.

ඉල්ලුම් පත්‍ර මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව විය යුතු අතර, 1964 දෙසැම්බර් මස 17 වැනි දිනට හෝ ඊට ප්‍රථම :—

" සභාපති,
ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670,
242, හැව්ලොක් පාර,
කොළඹ 5. "

යන ලිපිනයට ලැබෙන ලෙස එවිය යුතුය.

තැපැලේදී ප්‍රමාද වන හෝ නැතිවන ඉල්ලුම් පත්‍ර ගැන මෙම සංස්ථාව වග නො කියනු ඇත.

මෙම කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍ර නිකුත් නොකරනු ලැබේ. එමෙන් ම ඉල්ලුම් පත්‍ර ලැබුණු බැව් දන්වා නො එවන බැව් ද සැළකිය යුතුය.

ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර රජයේ හෝ රජයේ සංස්ථාවල සේවය කරන අපේක්ෂකයන්ගේ ඉල්ලුම් පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තු හෝ සංස්ථා මගින් එවිය යුතුය :—

(1) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය නොපිළි ගනු ලැබේ.) ;

(2) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(3) කම්කරු සුබ සාධක කටයුතු පිළිබඳ පළපුරුද්ද හා දැනුම ගැන සහතිකවල පිටපත් ;

(4) ක්‍රීඩා හා සාහිත්‍ය කටයුතු සංවිධානය පිළිබඳ සහතිකය ;

(5) ළඟදී ලබා ගත් චරිත සහතික තුනක් (රජයේ හෝ සංස්ථාවේ සේවකයන් සම්බන්ධයෙන් අවශ්‍ය ය.)

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
242, හැව්ලොක් පාර, කොළඹ 5,
1964 නොවැම්බර් මස 28 වැනි දින.

ලේකම්.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව**

**සුබ සාධක නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් කිරීම**

1. සම්පූර්ණ නම (පැහැදිලිව) :————.
2. ලියුම් ලැබෙන පිළිවෙල :————.
3. (අ) උපන් දිනය :————.
   (ආ) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :————.
4. ජාතිය :————.
5. අධ්‍යාපන සුදුසුකම් :————.
6. (අ) කම්කරු සුබසාධක කටයුතු පිළිබඳ පළපුරුද්ද හා දැනුම පිළිබඳ විස්තර :————.
   (ආ) ක්‍රීඩා හා සාහිත්‍ය කටයුතු සංවිධානය කිරීමේ හැකියාව පිළිබඳ විස්තර :————.
   (ඇ) සිංහල කථිකත්වය පිළිබඳ විස්තර :————
7. පාසැලින් අස්වූවාට පසු කරන ලද රැකියා පිළිබඳ විස්තර (දිනයන් හා අස්වීමට හේතු ද දක්වන්න.) :————.
8. වෙනත් කරුණු :————.

ඉහත සඳහන් කරුණු නිවැරදි බවට සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12–270/1—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### ලඝු/යතුරු ලේඛක තනතුර (ඉංග්‍රීසි)

ඉහත සඳහන් තනතුර සඳහා අපේක්ෂිත සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් ආකෘති පත්‍රය අනුව සකස් කර ගත් ඉල්ලුම් පත්‍ර, 1964 දෙසැම්බර් මස 16 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය :—

**වැටුප් ක්‍රමය.**—රු. 250—10×10. 15×10—500 (සියල්ල අඩංගු මාසික) (රු. 350 අවස්ථාවේ දී කාර්යක්ෂමතා කඩඉමකි)

**සුදුසුකම්.**—(අ) වයස අවුරුදු 19-25 අතර පිරිමින් විය යුතුය;

(ආ) ජ්‍යෙෂ්ඨය හෝ සමාන සහතිකයක් ලබා සිටිය යුතුය. සිංහල හා/හෝ ඉංග්‍රීසි 'සම්මාන' ලබා සිටින්නන් කෙරෙහි විශේෂයෙන් සලකනු ලැබේ;

(ඇ) විනාඩියකට වචන 100 වේගයෙන් ලඝු සටහනින් ලියා ගැනීමේ හැකියාවක් හා විනාඩියකට වචන 30 ක් ටයිප් කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

මෙම කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍ර නිකුත් නො කෙරෙන අතර, තැපැලේදී ප්‍රමාද වන හෝ නැති වන ඉල්ලුම් පත්‍ර පිළිබඳ මෙම සංස්ථාව වග නො කියනු ලැබේ. ඉල්ලුම් පත්‍ර ලැබුණ බැව් දන්වා නොඑවන බැව්ද සැළකිය යුතුය.

රජයේ අංශයේ සේවය කරන්නන්ගේ ඉල්ලුම් පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තු හෝ සංස්ථා මගින් එවිය යුතුය. සියළුම ඉල්ලුම් කරුවන් විසින් තමන්ගේ ඉල්ලුම් පත්‍රය සමග පහත සඳහන් සහතිකපත්වල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය නො පිළි ගනු ලැබේ.);

(ආ) උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය;

(ඇ) ලඝු/යතුරු ලේඛනය පිළිබඳ සහතිකය;

(ඈ) ළඟදී ලබා ගත් චරිත සහතික 3 ක්. (රජයේ හෝ සංස්ථා සේවකයන් සම්බන්ධයෙන් මෙය අවශ්‍ය නො වනු ඇත.)

ලේකම්.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670,
242, හැව්ලොක් පාර,
කොළඹ 5.
1964 නොවැම්බර් මස 29 වැනි දින.

### ආකෘති පත්‍රය

#### ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

#### ලඝු/යතුරු ලේඛක (ඉංග්‍රීසි) තනතුර සඳහා ඉල්ලුම් පත

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————.
4. ජාතිය :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :————.
6. ලඝුලේඛනය හා ටයිප් ගැසීම පිළිබඳ සුදුසුකම් :————.
7. පාසැලින් අස්වූවාට පසු කළ රක්ෂා පිළිබඳ විස්තර :————.
8. වෙනත් කරුණු :————.

මා විසින් මෙහි සඳහන් කොට ඇති කරුණු සත්‍ය බවට සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

12–270/2—64.247 දින අංක 14,028 දරන ගැසට් පත්‍රය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කොළඹ ක්‍රම අධි-ශිෂ්‍යත්ව ප්‍රදානය

ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්සයේ පුහුණුව දෙන කොළඹ ක්‍රමය යටතේ වූ, මතු කියවෙන අධි-ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු පිණිස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් අයැදුම් පත් කැඳවනු ලැබේ :—

| පාඨ මාර්ගය | | අධි-ශිෂ්‍යත්ව ගණන |
|---|---|---|
| (අ) හෙදකම් පාලන ඩිප්ලෝමාව | ... | 1 |
| (ආ) වින්නඹු ශික්ෂක ඩිප්ලෝමාව | ... | 5 |
| (ඉ) ශල්‍යාගාර කටයුතු විධි විෂයයෙහි සහතිකය | ... | 5 |

2. **යෝග්‍යතාවය පිළිබඳ කොන්දේසි මෙසේ වෙයි :**

**(අ) හෙදකම් පාලන ඩිප්ලෝමා පාඨ මාර්ගයට**

(i) අයැදුම් පත් බාර ගැනීම පියවන දාට වයස අවුරුදු 45ට පහළ සිටින හෙද පාලිකාවන් සහ (ඉහළ ශ්‍රේණියේ) සහකාර හෙද පාලිකාවන් ;

(ii) වින්නඹු කර්මය හෙවත් ශවකර්මය විෂයයෙහි සහතිකයක් ලබා සිටිය යුතුය ;

(iii) කණිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඒ හා සම තත්ත්වයේ සහතිකයක් ලබා සිටිය යුතුයි. වඩා ඉහළ සුදුසුකම් ඇත්තවුන්ට වැඩි කැමැත්තක් දක්වනු ඇත ;

(iv) රෝහල්වල හෙදකම් පාලනයෙහි යටත් පිරිසෙයින් පස් අවුරුදු පළපුරුද්දක්වත් තිබිය යුතුයි.

**(ආ) වින්නඹු ශික්ෂක ඩිප්ලෝමා පාඨ මාර්ගය**

(i) අයැදුම් පත් බාර ගැනීම පියවන දාට වයස අවුරුදු 45ට පහළ සිටින සොහොයුරියන්, ශික්ෂකයින් (ආචාරීන්) (පහළ ශ්‍රේණියේ) හෙද පාලිකාවන් ;

(ii) හෙදියක් ලෙස , සුදුසුකම් ලැබීමෙන් පසු යටත් පිරිසෙයින් හෙදකමෙහි තුන් අවුරුදු පළපුරුද්දක්වත් ලැබ සිටිය යුතුයි ;

(iii) කණිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඒ හා සම තත්ත්වයේ සහතිකයක් හෝ ලබා සිටිය යුතුයි. වඩා ඉහළ සුදුසුකම් ඇත්තවුන්ට වැඩි කැමැත්තක් දක්වනු ඇත ;

(iv) වින්නඹු කර්මය හෙවත් ශවකර්මය විෂයයෙහි සහතිකයක් ලබා සිටිය යුතුයි.

**(ඉ) ශල්‍යාගාර කටයුතු විධි සහතික පාඨමාර්ගයට**

(i) 1949 අංක 10 දරණ වෛද්‍ය සංශෝධිත පණතේ අ කොටස යටතේ ලේඛනාරූඪ වූ හෙදියන් ;

(ii) අයැදුම් පත් බාර ගැනීම පියවන දාට වයස අවුරුදු 45ට පහළ සිටිය යුතුයි ;

(iii) හෙදියක් ලෙස සුදුසුකම් ලැබීමෙන් පසු යටත් පිරිසෙයින් හෙදකමෙහි තුන් අවුරුදු පළපුරුද්දක්වත් ලැබ සිටිය යුතුයි ;

(iv) අබු ගණනේ කණිෂ්ඨ පාඨශාලා සහතික විභාගයෙන් හෝ ඒ හා සම තත්ත්වයේ විභාගයකින් හෝ සමත් වී සිටිය යුතුයි. වඩා ඉහළ සුදුසුකම් ඇත්තවුන්ට වැඩි කැමැත්තක් දක්වනු ඇත.

**සංලක්ෂ්‍යය :**—මේ විශේෂිතයෙහි පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

3. සියළු මැ අයැදුම්කාරියන් ලාංකිකයන් වියැ යුතුයි. ලාංකික යනුවෙන් අදහස් වනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් හෝ ලංකාවේ රට වැසියන් වූ අයයි.

4. මානසික සෞඛ්‍ය අතින් මෙන් මැ කායික සෞඛ්‍ය අතින් ද ඉහළ තත්ත්වයක සිටීම අවශ්‍යයි. තෝරා ගනු ලබන අයදුම්කාරියන් මානසික සහ කායික සෞඛ්‍ය අතින් යෝග්‍යදැයි සොයා බලනු පිණිස රජයේ වෛද්‍ය නිලධාරී මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් ද ඔවුන් සමත් වියැ යුතුයි.

5. පසු වැ දැනුම් දෙනු ලබන දිනයෙකැ සහ වේලාවෙකැ කොළඹැ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට අපේක්ෂිකාවන් පැමිණ පෙනී සිටිය යුතු වේ. මේ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් හෝ කිසිත් ගෙවනු නො ලැබේ.

6. **තෝරාගනු ලබන අපේක්ෂිකාවන්.**—වෙනත් කොන්දේසි අතර, නියමිත පාඨමාර්ගය හදාරන බවටත්, තම අධ්‍යයන පාඨමාර්ගය සතුටුදායක ලෙස හදාරා නිම කරන බවටත්, තම අධ්‍යයන පාඨමාර්ගය සතුටුදායක ලෙස හදාරා නිම කිරීමෙන් පසු (රජයේ නිගමනය පරිදි) නියමිත කාල-සීමාවක් ගතවන තෙක් රජය යටතේ සේවය කරන බවටත් පොරොන්දුවෙමින් රජය සමග ගිවිසුමකට බැඳිය යුතු වේ.

7. ළගෙනුම ලබන රටට යෑමට සහ එහි සිට පැමිණීමට යන ගමන් වියදම, කොළඹ ක්‍රම බලධාරීන් විසින් නිගමනය කරනු ලබන ප්‍රමාණයක මාස් පතා උප වේතනයක්, සම්පූර්ණ පඩි පිට අධ්‍යයන නිවාඩු, රට තුළැ, ගමන් වියදම සහ ශික්ෂක බරපැන් (ගාස්තු) මේ අධි-ශිෂ්‍යත්ව ප්‍රදානයට අයත් වේ. එසේ ද වුවත්, ගෙවල් කුලී දීමනාව වත්, වියෝවීමේ දීමනාව වත් ගෙවනු නො ලැබේ.

8. මෙහි මතු දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුසාරයෙන් අයැදුම් පත් පිළියෙල කොටැ, 1964.12.21 වන දා හෝ ඊට පෙර හෝ මා වෙත ලැබෙන සේ ලේඛනගත තැපැලෙන් ඒ ඒ පරිපාලක නිලධාරීන් මගින්, කොළොඹ තැ. පෙ. අංක 500 හිමි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙත ලිපිනය කොටැ, එවියැ යුතුයි. මොන මැ හේතුවක් නිසාවත් අයැදුම් පත් මා නමට පුද්ගලිකව වැ අමතා නො එවියැ යුතුයි. එබඳු අයැදුම් පතක් ලැබුණොත් එය පිටු දක්නු ලැබේ. අයැදුම් පත් බහා එවන ලියුම් කවරයේ වම් පස උඩු කෙළවරේ, "හෙදකම් පාලනය/වින්නඹු ශික්ෂක ඩිප්ලෝමා/ශල්‍යාගාර කටයුතු විධි පාඨ මාර්ගය සඳහා කො. ක්‍ර. අධි ශිෂ්‍යත්වය" කියා හනක් තැබිය යුතුයි.

9. යෝජිත පුහුණුවෙන් වැඩි පඩි-නඩි ලැබීමට හිමිකමක් වත් ඉහළ ශ්‍රේණිවලට උසස් කරනු ලැබීමට හිමිකමක් වත් තෝරා ගනු ලබන අපේක්ෂිකාවන්ට ගෙන නො දෙයි.

10. සෑම අතින් මැ මේ දැන්වීමේ නියමයන්ට අනුකූල නො වන අයැදුම් පත් පිටු දක්නු ලැබේ.

ඇම්. ජේ. ද ඇස්. ජයසේකර,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට

1964 නොවැම්බර් මස 9 වන දා, කොළඹ,
තැ. පෙ. 500 හිමි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
කාර්යාලයේ දී යැ.

### කොළඹ ක්‍රමය යටතේ නිව් සවුත් වේල්සයේ දී පශ්චාත් උපාධි හෙදකම් හැදෑරීමේ අධි-ශිෂ්‍යත්වය සඳහා අයදුම් පත් ආකෘතිය

1. සම්පූර්ණ නම :————.

(පැහැදිලි වටකුරු අකුරෙන්)

2. පදවි නාමය :————.

3. ආයතනය :————.

4. ජාතිය :————.

5. උපන් දිනය සහ තැන :————.
1964.12.21 වන දාට හරි වයස : අවු.——යි. මාස——යි.

6. විවාහක ද තනිකඩ ද යන වග :————.

7. අධ්‍යාපන සුදුසුකම් :————.

8. වෘත්තීය සුදුසුකම් :————.

9. දැනට දරන තනතුර සහ ඊට පත් වූ දිනය :————.

10. හෙදියක් ලෙස සුදුසුකම් ලැබීමෙන් පසු දෙපාර්තමේන්තුවට පත් වූ දිනයත්, එතැන් පටන් සේවා තොරතුරුත් : ————.

11. පළපුරුද්ද පිළිබඳ තොරතුරු :————.

12. අයැදුම් පතට ආධාර පිණිස හුවා දැක්විය හැකි විශේෂ හිමිකම් වෙතොත්, එය :————.

————,
අයැදුම්කාරියගේ අත්සන.

1964 ..................................
පරිපාලක නිලධාරියගේ නිර්දේශය.

————,
පරිපාලක නිලධාරියාගේ අත්සන
සහ පදවිය.

1964 ..................................
විමධ්‍යගත කොට්ඨාශ ප්‍රධානයාගේ නිර්දේශය.

————,
අත්සන සහ පදවිය.

1964 ..................................

12-163—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

### පුරප්පාඩු

සාර්ථක ලෙස පුහුණුව හමාර කිරීමෙන් පසුව පහත සඳහන් තනතුරුවලට පත් කිරීම සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙම පත්වීම් තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත්වේ. තෝරාගනු ලබන අය විසින් තම ආධුනික කාලය තුළදී සිංහල පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගැනීම අවශ්‍යය. පුහුණුවීමේ කාලය තුළදී පුහුණුවීමේ කටයුතු පිළිබඳ ප්‍රගතිය අසතුටුදායක බව පෙනී ගියහොත් කලින් දැනුම් දීමක් නොමැතිව සේවාවන් අවසන් කළ හැක.

**වැටුප් ක්‍රමය :—**

රු. 106—6×18—7×4—8×1—10=4 රු. 290 මීට අමතරව රජයේ ප්‍රමාණයන්ට අනුකූලව ගෙවල් කුලී සහ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ.

**සුදුසුකම් :—**

(අ) **නිර්දිෂ්ඨ—සැලසුම් යන්ත්‍ර ක්‍රියාකරවන්නන්ගේ තනතුරු :—** භෞතික විද්‍යාව හෝ ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික හෝ උසස්) සමග උසස් පාඨශාලා සහතික පත්‍රය **හෝ** එක් අවස්ථාවකදීම විෂයයන් 3 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය (උසස් පෙළ) **හෝ** ඒ හා සමාන විභාගයකින් සමත්වීම සමඟ, එක්වර සම්මාන තුනක් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සම්මාන තුනක් සහිත සම්පූර්ණයෙන් (විෂයයන් 6 කින්) සමත් වීම.

(ආ) **ජීද්‍ර යන්ත්‍ර ක්‍රියා කරවන්නියන්ගේ තනතුරු :—**

(i) භෞතික විද්‍යාව හෝ ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික හෝ උසස්) සමග උසස් පාඨශාලා සහතික පත්‍රය **හෝ** එක් අවස්ථාවකදීම විෂයයන් 3 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය (උසස් පෙළ) **හෝ** ඒ හා සමාන විභාගයකින් සමත්වීම සමඟ, එක්වර සම්මාන තුනක් සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සම්මාන තුනක් සහිත සම්පූර්ණයෙන් (විෂයයන් 6 කින්) සමත් වීම, හා

(ii) විනාඩියකට වචන 40 ක වේගයකින් ඉංග්‍රීසි යතුරු ලිවීමේ හෝ විනාඩියකට වචන 30 ක වේගයෙන් සිංහල යතුරු ලිවීමේ හැකියාව.

මෙයින් කුමන තනතුරක් සඳහා වුවද අයැදුම්කරුවන් 1964 දෙසැම්බර් මස 19 වැනි දිනට වයස අවුරුදු 26 ට වැඩි නොවන අය විය යුතුය.

**සැලකිය යුතුයි.**—ඉහත සඳහන් අධ්‍යාපනික සුදුසුකම් ඇති, 63.8.1 වැනි දිනට පෙර පෞද්ගලික රක්ෂණ සමාගම්වල සේවය කළ සේවකයන්ට සහ සංස්ථාවේ සේවකයන්ට වයස ගැන නොසළකා අයැදුම් පත් එවිය හැක.

"නිර්දිෂ්ඨ—සැලසුම් යන්ත්‍ර ක්‍රියා කරවන්නන්ගේ තනතුරු" හෝ "ජීද්‍ර යන්ත්‍ර ක්‍රියා කරවන්නියන්ගේ තනතුරු" යන්න නිසි පරිදි ලියුම් කවරයේ සඳහන් කර 1964 දෙසැම්බර් මස 19 වැනි දින හෝ ඊට පෙර කොළඹ—2, 288, යුනියන් පෙදෙසේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධානාධිකාරී වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත් මගින් අයදුම් කළ යුතුය. තැපැල් මගින් අයැදුම් පත්වල ආකෘති පත්‍ර ඉල්ලා එවන අය මුද්දරයක් ගසා තමන්ගේ ලිපිනය ලියන ලද ලියුම් කවරයක් ද සමග "අයැදුම් පත්" යන්න සඳහන් කර එවිය යුතුය.

ඩී. ඇම්. ඒ. ස්පෙල්ඩ්වින්,
ප්‍රධාන අධිකාරී.

288. යුනියන් පෙදෙස,
කොළඹ 2.

12-288—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව

### මුරකරු තනතුර සඳහා ඇබෑර්තු

මෙම සංස්ථාවේ ප්‍රධාන කායශාලයේ මුරකරු තනතුර සඳහා, අයදුම් පත් ලාංකිකයින්ගෙන් 1964 දෙසැම්බර් මස 18 වෙනි දින දක්වා භාරගනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම් :—**අයදුම්කරුවන් මනා දේහ ශක්තියෙන් යුක්ත විය යුතු අතර, සිංහල විෂයයක් සහිතව ඉංග්‍රීසි මාධ්‍යයෙන් කණිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ, ඉංග්‍රීසි විෂයයක් සහිතව සිංහල මාධ්‍යයෙන් කණිෂ්ඨ පාඨශාලා සහතිකය ලබා තිබිය යුතුය. රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ සැලකිය යුතු පුද්ගලික ආයතනයක, මුරකරු වශයෙන් අඩුගණනේ වර්ෂ දෙකක සේවයක් තිබිය යුතුය. කායශාල හෝ ගබඩා වැඩ පිළිබඳ පළපුරුද්ද, විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

**වයස :—**අවුරුදු 25 සිට 35 දක්වා.

අයදුම්කරුවන් හොඳින් නිර්දේශ කරනු ලැබූවන් විය යුතුය. පහත සඳහන් සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමග එවිය යුතුය :—

1. ප්‍රදේශයේ ග්‍රාම සේවක තැනගෙන් චරිත සහතිකයක්.
2. සැලකිය යුතු අයවළුන්ගෙන් තවත් චරිත සහතික දෙකක්.
3. සෞඛ්‍යය පිළිබඳ සහතිකය.

වැටුප් :—රු. 120—2.50×30—195 දක්වා (මසකට සියල්ල අඩංගුව)

වයස, අධ්‍යාපනය, ලබා ඇති සුදුසුකම් හා පසුගිය හා දැනට රැකියාව, යනාදී සියළු විස්තර ඇතුළත්ව, අයදුම් පත් ආධුනිකයින්ගේ අත් අකුරින්ම ලියා එවිය යුතුය.

ලේකම්,
ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව.

තැ. පෙ. 194,
48, ශ්‍රී ජිනරතන පාර,
කොළඹ 2.

12-175/1—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

## ගල්ඔය සීනි කර්මාන්තය

**වැද්දුම්කරුවන් සහ විදුලි කාර්මිකයන් සඳහා ඇබෑර්තු**

හිඟුරානේ පිහිටි ගල්ඔය සීනි කර්මාන්තායතනයේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයින්ගෙන් ඉල්ලුම්පත් භාරගනු ලැබේ:—

| | |
|---|---|
| වද්දුම්කරුවන් ඇබෑර්තු | 10 |
| විදුලි කාර්මිකයින් | 5 |
| ඉන්ස්ට්‍රුමන්ට් මිකැනික් | 1 |

**සුදුසුකම් :—**

ඉල්ලුම්කරුවන් වෘත්තීය පුහුණුවන්නෙකු හැටියට පිළිගත් ඉංජිනේරු කම්හලක අඩු වශයෙන් අවුරුදු හතරක් සම්පූර්ණ කර තිබිය යුතු අතර කාර්මික ආයතනයක අවුරුදු 10 වැඩකළ පළපුරුද්දක් තිබිය යුතුයි.

**වේතන ප්‍රමාණය :**

රුපියල් 7.28 ක දෛනික පඩියක්. ආණ්ඩුවෙන් ලැබෙන ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර අමතරව ගෙවනු ලැබේ.

කොළඹ 7, බුලර්ස් පාරේ, අංක 415 දරණ ස්ථානයේ පිහිටි ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්යාලයෙන් ඉල්ලුම්පත් ලබාගෙන, සම්පූර්ණ කොට, ඉරක්කාමම්, හිඟුරානේ පිහිටි ගල්ඔය සීනි කර්මාන්තායතනයේ කළමනාකරු වෙත ලැබෙනසේ 1964 දෙසැම්බර් මස 19 වෙනි දිනට පෙර එවිය යුතුයි.

12-220—64.12. 4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**උළු අංශයේ ඇබෑර්තු**

මෙම මණ්ඩලයේ උළු නිෂ්පාදන අංශයේ පහත සඳහන් ඇබෑර්තු සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. මෙම තනතුරු ස්ථිර හා සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභ සහිත ඒවා වේ. මෙම තනතුරුවලට අදාල පඩි පරිමාණ මාසික හා සියළු දීමනා ඇතුළු ඒවා වේ. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ අධ්‍යාපනික හා පළපුරුදුකම් පිළිබඳ සුදුසුකම් අනුව මෙම පඩි පරිමාණයෙහි සුදුසු පියවරක තබනු ඇත.

1. **ප්‍රෙස් යන්ත්‍රවලට මැටි සපයන්නෝ :—** රු. 135—3×10 ක. ඉ. 4—×5—රු. 185.

**සුදුසුකම් :**—රට උළු කර්මාන්ත ශාලාවක ප්‍රෙස් යන්ත්‍රයට මැටි සපයන්නෙකු ලෙස අඩු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුය.

2. **බොයිලර් ඇටෙන්ඩන්ට්කරුවෝ :—** රු. 120—2.50×10 ක. ඉ. 43.50×5—රු. 162.50

**සුදුසුකම් :** බොයිලර්මන් සහතිකයක් ලබා තිබිය යුතු අතර පිළිගත හැකි කර්මාන්ත ශාලාවක බොයිලර් ඇටෙන්ඩන්ට් කෙනෙකු වශයෙන් සේවය කර පළපුරුද්දක් තිබිය යුතුය.

**පොදු සුදුසුකම් :**

ඉහත සඳහන් සියලු තනතුරු සඳහා අයැදුම් කරුවන් ලංකා පුරවැසියන්වූ වයස අවුරුදු 18 ත් 45 ත් අතරවූ දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට කැමැති හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් යුතු තම නිල කාර්යයන් සිංහලෙන් කළ හැකි අය විය යුතුය.

අනෙකුත් සේවා කොන්දේසි මෙම තනතුරුවලට අදාල නීතිගත සේවා පනත් හා මෙම මණ්ඩලයේ උළු නිෂ්පාදන අංශයේ සාමාන්‍ය සේවා කොන්දේසි අනුව සම්පාදිතය.

අයදුම් පත් එවිය යුත්තේ ඒ සඳහා මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍ර මගිනි. මෙම ආකෘති පත්‍ර මෙම කාර්යාලයට පැමිණ හෝ තම ලිපිනය හා තැපැල් මුද්දර යෙදු කවරයක් පහත සඳහන් නිලධාරි තැනට එවීමෙන් ලබා ගත හැකිය.

අයදුම් පත් නියමිත ප්‍රකාර සම්පූර්ණකර කවරයේ වම් උඩ කෙළවරේ "උළු අංශයේ ඇබෑර්තු" යන්න සඳහන් කර ලියා පදිංචි කළ තැපෑලෙන් පහත සඳහන් නිලධාරි තැනට එවිය යුතුය.

අයදුම් පත් භාරගන්නා අවසාන දිනය 1964 දෙසැම්බර් 21 වැනි දින පස්වරු 4.00 දක්වා වේ.

සාමාන්‍යාධිකාරි,
උළු අංශය.

ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය,
181, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 2.

12-252—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංක : ඊ. 5/62.

## ගණකාධිකාරී සේවයේ IV වැනි පන්තියට බඳවා ගැනීමේ විභාගය—1963

ඉහත සඳහන් විභාගය සම්බන්ධයෙන් 1964 ජනවාරි මස 31 වැනි දිනය සහ අංක 13,937 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1964 ජනවාරි මස 23 වැනි දිනැති නිවේදනයෙන් සංශෝධනය කරන ලද 1963 නොවැම්බර් මස 29 වැනි දිනය සහ අංක 13,837 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1963 නොවැම්බර් මස 25 වැනි දිනැති නිවේදනය, තවදුරටත් පහත සඳහන් අයුරු සංශෝධනය කළ බව මෙයින් දන්වනු ලැබේ.

1. 4 වැනි ඡේදයේ සංශෝධිත සංලක්ෂ්‍යය ද කපා හැර ඒ වෙනුවට මෙසේ යොදන්න :—

**සංලක්ෂ්‍යය :**—ඉහත සඳහන් 4 (ඇ) (I) සිට (XV) දක්වා වර්ගවලට අයත් නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුස්සන් වීමට 1964 ජූලි මස 1 වැනි දින වන විට සිංහල ප්‍රවීණතා පරීක්ෂණයේ 1 වැනි ශ්‍රේණියෙන් සමර්ථවී හෝ එයින් නිදහස් වී සිටිය යුතුය.

2. පිළිවෙලින් 1963 සැප්තැම්බර් මස 6 වැනි සහ 1963 නොවැම්බර් මස 29 වැනි දිනයන් හා 13,751 සහ 13,837 දරන ගැසට් පත්‍රවල ප්‍රසිද්ධ කරන ලද 1963 සැප්තැම්බර් මස 2 වැනි හා 1963 නොවැම්බර් මස 25 වැනි දිනයන් දරන නිවේදන අනුව ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ නිලධාරීන් ඔවුන්ගේ එම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කර නොමැති නම්, නැවතත් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් නොකළ යුතුය. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර මෙම විභාගය සඳහා සළකා බලනු ලැබේ.

3. පිළිවෙලින් 1963 සැප්තැම්බර් මස 6 වැනි සහ 1963 නොවැම්බර් මස 29 වැනි දිනයන් හා 13,751 සහ 13,837 දරන ගැසට් පත්‍රවල ප්‍රසිද්ධ කරන ලද 1963 සැප්තැම්බර් මස 2 වැනි හා 1963 නොවැම්බර් මස 25 වැනි දිනයන් දරන නිවේදන අනුව ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ නිලධාරීන්, ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර 1964 ජූනි මස 17 වැනි දිනැති අංක ඊ. 5/2/62 දරන මගේ ලිපියෙන් ප්‍රතික්ෂේප කර ඇත්නම් එවැනි නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට කැමති නම්, 1964 ජූලි මස 1 වැනි දිනට I වැනි ශ්‍රේණියේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත්වී හෝ එයින් නිදහස් වී සිටීද යන වග සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් මට දැනුම් දිය යුතුය. මෙම ලිපි ඉදිරිපත් කරන විට එම නිලධාරීන්, 1964 ජූලි මස 1 වැනි දින වන විට I වැනි ශ්‍රේණියේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත් වී හෝ එයින් නිදහස් කර ඇති බව නිශ්චිත වශයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සඳහන් කළ යුතුය. එවැනි ලිපි 1964 දෙසැම්බර් මස 18 වැනි දින හෝ ඊට ප්‍රථමයෙන් මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුය.

4. ඉහත 1 වැනි ඡේදයේ සඳහන් සංශෝධිත සංලක්ෂ්‍යය අනුව, මෙම විභාගයට ඉල්ලුම් කිරීමට සුදුසුකම් තිබේ නම් සහ මීට ප්‍රථමයෙන් ඉල්ලුම් පත් එවා නැතිනම්, එවැනි නිලධාරීන් 1964 දෙසැම්බර් මස 18 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් ඉල්ලුම් පත් එවිය යුතුය. මේ සඳහා අයදුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය.

5. තෝරා ගැනීමේ ක්‍රමය පහත දක්වා ඇති පරිදිය :—

(අ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත් වී හෝ එයින් නිදහස් වී ඇත්තාවූද, මෙම විභාගයේ මුළු ලකුණු ගණනින් 60% කට වඩා ලකුණු ලබා ගත්තාවූද, නිලධාරීන්ට පත්වීම් දීමේදී ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

(ආ) තවත් පුරප්පාඩු වෙතොත් ඒවා මෙම විභාගයේ මුළු ලකුණු ගණනින් 75% කට වඩා ලකුණු ලබා ගත්තාවූ නිලධාරීන් පත්කිරීමෙන් පුරවනු ලැබේ.

මෙම කොන්දේසි මෙම විභාගයට **පමණක්** අදාළ වනු ඇත.

6. ලිඛිත පරීක්ෂණය 1965 ජනවාරි මසදී පමණ කොළඹදී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණය පැවැත්වෙන නියම දිනය සහ ස්ථානය අයදුම්කරුවන්ට යථා කාලයේදී දැනුම් දෙනු ඇත.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ, තැ. පෙ. අංක 500,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

12-157—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

අංක ඊ 6/64.

## ගණන් පරීක්‍ෂක සේවයේ III වැනි පන්තියට ගණන් පරීක්‍ෂක අධිකාරීන් බඳවා ගැනීමේ විභාගය

ඉහත සඳහන් විභාගය සම්බන්ධයෙන් 1964 ජූනි මස 26 වැනි දින අංක 14,080 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1964 ජූනි මස 20 වැනි දින දරණ නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය කළ බව මෙයින් දන්වනු ලැබේ:—

1. 4අ(i) සහ 4අ(ii) ඡේදයන් කපාහැර ඒ වෙනුවට මෙසේ යොදන්න.

"දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුස්සන් වීමට 1964 ජූලි මස 1 වැනි දින වන විට සිංහල ප්‍රවීණතා පරීක්ෂණයේ 1 වැනි ශ්‍රේණියෙන් සමර්ථ වී හෝ එයින් නිදහස් වී සිටිය යුතුය."

2. ඉහත 1 වැනි ඡේදයේ සඳහන් සංශෝධිත සුදුසුකාවය පිළිබඳ කොන්දේසි අනුව මෙම විභාගයට ඉල්ලුම් කිරීමට සුදුසුකම් තිබේ නම් සහ මීට ප්‍රථමයෙන් ඉල්ලුම් පත් එවා නැත්නම් එවැනි නිලධාරීන්ට 1964 දෙසැම්බර් මස 18 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් මෙම විභාගයට ඉල්ලුම් පත් එවිය හැකිය. මේ සඳහා අයදුම්පත් මෙම කායාීලයෙන් ලබාගත හැකිය.

3. 1964 ජූනි මස 26 වැනි දින අංක 14,080 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1964 ජූනි මස 20 වැනි දින දරණ නිවේදනය අනුව ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් නැවතත් ඉල්ලුම් කිරීම අනවශ්‍යය. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර මෙම විභාගය සඳහා සලකා බලනු ලැබේ.

4. තෝරා ගැනීමේ ක්‍රමය පහත දක්වා ඇති පරිදිය:—

(අ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත් වී හෝ එයින් නිදහස්වී ඇත්තාවූද, මෙම විභාගයේ මුළු ලකුණු ගණනින් 60%කට වඩා ලකුණු ලබාගත්තාවූද, නිලධාරීන්ට පත්වීම් දීමේදී ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

(ආ) තවත් පුරප්පාඩු වෙතොත් ඒවා මෙම විභාගයේ මුළු ලකුණු ගණනින් 75% කට වඩා ලකුණු ලබා ගත්තාවූ නිලධාරීන් පත් කිරීමෙන් පුරවනු ලැබේ.

මෙම කොන්දේසි මෙම විභාගයට **පමණක්** අදාළ වනු ඇත.

5. ලිඛිත පරීක්ෂණය 1965 ජනවාරි මසදී පමණ කොළඹදී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණය පැවැත්වෙන නියම දිනය සහ ස්ථානය අයදුම්කරුවන්ට යථා කාලයේදී දැනුම් දෙනු ඇත.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ, තැ. පෙ. අංක 500,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායාීලයේදීය.

12–158—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 500, කොළඹ 1). කැපිකළ ගල්තාර සැපයීම සඳහා 1964 දෙසැම්බර් 29 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1964 දෙසැම්බර් 28 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1964 දෙසැම්බර් 4 වැනි දින,
කොළඹ දී ය.

12–255—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

විදුලි යන්ත්‍රානුසාරයෙන් රෙදි වියන පේෂකර්ම යන්ත්‍ර සහ උපකරණ තොගයක් සැපයීම සඳහා ඒවා නිපදවන්නන්ගෙන් සහ ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් 65.1.20 වැනි දින පෙ.ව. 10.30 දක්වා ම විසින් මිළ ගණන් බාර ගනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර සඳහා දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ
වැඩ බලන අධ්‍යක්‍ෂ.

1964.11.30,
කොළඹ 7,
ටොරින්ටන් චතුරශ්‍රයේදීය.

12–128—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### හම්බන්තොට උප කොට්ඨාශය

වලව් වම් ඉවුරු ව්‍යාපාරයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1964 දෙසැම්බර් මස 29 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා තංගල්ල, දකුණු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

(අ) ඇස්.ආර්.බී. ඇලේ 1 වැනි සැතපුම ප්‍රකෘතිමත් කිරීම.
(ආ) ඇස්.ආර්.බී. ඇලේ 2 වැනි සැතපුම ප්‍රකෘතිමත් කිරීම.
(ඇ) ඇස්.ආර්.බී. ඇලේ 3 වැනි සැතපුම ප්‍රකෘතිමත් කිරීම.
(ඈ) ඇස්.ආර්.බී. ඇලේ 4 වැනි සැතපුම ප්‍රකෘතිමත් කිරීම.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 40,000 ට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් ඇස්.ආර්.බී. ඇලේ 1 වැනි සැතපුම ප්‍රකෘතිමත් කිරීම සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 27,000ට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවනට පමණක් ඇස්.ආර්.බී. ඇලේ 2 වැනි සැතපුම ප්‍රකෘතිමත් කිරීම සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000 ට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවනට පමණක් ඇස්.ආර්.බී. ඇලේ 3 වැනි සැතපුම ප්‍රකෘතිමත් කිරීම සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 31,000 ට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් ඇස්.ආර්.බී. ඇලේ 4 වැනි සැතපුම ප්‍රකෘතිමත් කිරීම සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 දෙසැම්බර් මස 24 වෙනි බ්‍රහස්පතින්දා වන තෙක් (එදින ඇතුළුව) කායාීල වේලාවන් තුළදී හම්බන්තොට, ගාල්ල, තිස්ස, ඇඹිලිපිටිය, වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායාීලයෙන් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර්

ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරිමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් (එක ටෙන්ඩරයක් සඳහා) වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඹීල යේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩර් ගැන වැඩි විස්තර, ගිවිසුම, වැඩ පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කායඹීලයීය වේලාවන් තුළදී හම්බන්තොට වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

වී. කුලසේගරම්,
වාරිමාර්ග ඉංජිනේරු, හම්බන්තොට උප කොට්ඨාශය.

හම්බන්තොට,
1964 නොවැම්බර් මස 24 දින දීය.

12-80—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරයේ ප්‍රධාන වම්ඇලේ අතු ඇලේ 4 වැනි සැතපුම ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 ජනවාරි මස 5 වැනි අඟහරුවාදා පෙරවරු 10.00 දක්වා වයඹ කොට්ඨාශයේ කුරුණෑගල ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් භාරගෙන ඒ වේලාවේදීම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000 කට හෝ ඊට වැඩි ගණන්වලට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත්‍ර ඉදිරිපත් කළ හැක.

1965 ක්වූ ජනවාරි මස 1 වැනි දින දක්වා කායඹීල වේලාවලදී වයඹ කොට්ඨාශයේ සෑම උප කොට්ඨාශයකම වාරිමාර්ග ඉංජිනේරු කායඹීල වලින් ලබාගත් ටෙන්ඩර් ෆෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා සෑම උප කොට්ඨශයකම වාරි මාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම ලබා ගැනීමේදී රුපියල් 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ෆෝර්ම ලබා ගන්නා වාරිමාර්ග ඉංජිනේරු කායඹීලයේ ඉංජිනේරුතුමා වෙත හෝ එම මුදල ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

මේ ටෙන්ඩර් ගැන සියලුම තොරතුරු, වැඩි විස්තර, ගිවිසුම් වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කායඹීල වේලාවන් තුළදී හක්වටුනා ඔය ව්‍යාපාරය භාර සහකාර වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් විමසා දැනගත හැකිය.

ඇස්. සිවලිංගම්,
සහකාර වාරිමාර්ග ඉංජිනේරු තැන.
හක්වටුනා ඔය ජලාශ ව්‍යාපාරය.

1964ක්වූ නොවැම්බර් මස 23 වැනි ඉරුදින,
මකුල්පොත දීය.

12-119—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පුත්තලම උප කොට්ඨාශය

කරවිට යෝද ඇල ව්‍යාපාරයේ කරවිට යෝද ඇලෙහි පළමුවෙනි සැතපුම් තුනෙහි ගංවතුර අලාබහානි අඑත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් පත් 1964 දෙසැම්බර් මස 29 වෙනි දින පෙ. ව. 10 දක්වා කුරුණෑගල දී වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 21,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 දෙසැම්බර් මස 24 වෙනි බ්‍රහස්පතින්දා වන තෙක් (එදින ඇතුළුව) කායඹීලීය වේලාවන් තුළදී පහත සඳහන් වාරිමාර්ග කායඹීලයන්හි ඉංජිනේරු මහතුන්ගෙන් ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි:—

(1) පුත්තලම. (3) කුරුණෑගල.
(2) නිකවැරටිය (4) හක්වටුනා ඔය.
(5) රාජාංගන.

ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායඹීලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කායඹීලීය වේලාවන් තුළදී ඉහත සඳහන් වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

එම්. එම්. සිවප්‍රගාසම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
පුත්තලම උප කොටස.

වාරිමාර්ග කායඹීලය,
පුත්තලම, 1964.11.26 වෙනි දින.

12-166—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කුරුණෑගල උප කොට්ඨාශය

කුරුණෑගල උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1964ක්වූ දෙසැම්බර් මස 29 වැනි අඟහරුවද පෙරවරු 10.00 දක්වා වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් භාරගෙන ඒ වේලාවේදීම විවෘත කරණු ලැබේ.

| වැඩ විස්තරය | | | | ලියා පදිංචි ප්‍රමාණය | | ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|---|---|
| | | | | රු. ශ. | | රු. ශ. |
| දෙමෝදර වැව වැඩි දියුණු කිරීම | ... | ... | ... | 20,000 0 | ... | 25 0 |
| දින්ගොල්ලාගම අමුණ වැඩි දියුණු කිරීම | ... | ... | ... | 20,000 0 | ... | 25 0 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මෙම වැඩ ඉදිරියෙන් සඳහන් ප්‍රමාණයට හා ඊට වැඩි ගණන් වලට ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් දැමීමට සුදුස්සෝ වෙති.

3. මේ සඳහා ටෙන්ඩර් දැමිය හැක්කේ වයඹ කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගෙන් වර්ෂ 1964 දෙසැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්ද හෝ ඊට පෙරින් කාර්යාල වේලාව තුලදී ලබාගත හැකි ටෙන්ඩර් ආකෘත පත්‍ර වලටය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලැබීමට කොන්ත්‍රාත් කරු සුදුසුදැයි සොයා බැලීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් තමාගේ කොන්ත්‍රාත් සටහන් පොත සහ දනට තමා යටතෙහි ඇති කොන්ත්‍රාත්වල වටිනාකම සඳහන් ප්‍රකාශනයක් වාරිමාර්ග ඉංජිනේරු වරුන් වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට පෙර ඉහත සඳහන් ටෙන්ඩර් තැන්පත් මුදල් කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ කොළඹ වාරිමාර්ග අධ්‍යක්ෂක තුමාගේ කාර්යාලයේ හෝ, වයඹ කොට්ඨාශයේ ඕනෑම වාරිමාර්ග ඉංජිනේරු කෙනෙකු වෙත තැන්පත්කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩර් ගැන අවශ්‍ය සැම විස්තරයක්ම කුරුණෑගල උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කාර්යාල වේලාවලදී ලබාගත හැක.

වාරිමාර්ග කාර්යාලය,
කුරුණෑගල. 26.11.64

කේ. ෂන්මුගරාජා,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
කුරුණෑගල උප කොට්ඨාශය.

12–134—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට ජීප් රථයක් සැපයීම සඳහා කොළඹ 7 එඩින්බරෝ චන්ද්‍රවංකයේ අංක 42 ස්ථානයෙහි පිහිටි ගොවිජන සේවා දෙපාර්මේන්තුවේ ටැන්ඩර් කැඳවීමේ මණ්ඩලයේ සභාපති විසින් 1965 ජනවාරි මස 26 වෙනි අඟහරුවාදා පස්වරු 2.30 දක්වා පිළිගත් මෝටර් රථ වෙළඳුන්ගෙන් ටැන්ඩර් පත් බාරගනු ලැබේ.

2 ටැන්ඩර් සඳහා තැන්පත් වශයෙන් රු. 100ක් කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 ස්ථානයේ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණන් අංශයට භාරදී ලබා ගත් රිසිට් පතක් ඉදිරිපත් කරන අයදුම්කරුවන් ට, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 336 දරණ ස්ථානයේ පිහිටි ගොවිජන සේවා දෙපාර්මේන්තුවෙන් 1964 දෙසැම්බර් 24 වෙනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා ටැන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට පුළුවන. ටැන්ඩර් පත්‍ර පිටපත් 2ක් සහිතව ඉදිරිපත් කළ යුතුය.

3. මේ සඳහා වැඩි විස්තර අවශ්‍ය වුවහොත් පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ජේ. වී. ෆොන්සේකා,
ගොවිජන සේවා කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
අංක 336, ඩීන්ස් පාර,
තැ. පෙ. 579, කොළඹ 10.

12–198—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිළ යෝජනා ක්‍රමය හා වී කෙටීම

කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42, ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මඩකලපුවේ රජයේ හාල් මෝලේ 1964.10.1 සිට 1965.9.30 කාල සීමාව තුළ එකතුවන හාල් කුඩු (නිවුඩු) මිළදී ගෙනයාම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් පත් 1964 දෙසැම්බර් 21 වැනි සඳුදා අ.භා. 2.30 වන තෙක් බාරගනු ලැබේ.

2. දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60, හෝර්ටන් පෙදෙස කාර්යාලයෙහි ගණකාධිකාරී තැනට රු. 50 ක තැන්පත් මුදලක් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියක් අංක 42, එඩින්බරෝ චන්ද්‍රවංක කාර්යාලයේ ටැන්ඩර් අංශයට ඉදිරිපත්කොට ලබාගන්නා ලද ටැන්ඩර්පත් අනු පිටපතක්ද සහිතව පුරවා එවිය යුතුයි. 1964 දෙසැම්බර් 21 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටැන්ඩර්පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර මඩකලපුවේ සහකාර ගොවිජන සේවා කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ අංක 336, ඩීන්ස් පාර කොළඹ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තු හාල් මෝල් අංශයෙන් හෝ පහත සඳහන් කාර්යාලයෙන් දැනගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1964 දෙසැම්බර් 4 දින,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

12–232—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම රසායන ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සැපයීම සඳහා 1964 දෙසැම්බර් 18 දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ. ඇසිරීම, ප්‍රවාහන හා වාහන වලට පැටවීම ආදිය ඇතුළත්ව පහත සඳහන් ප්‍රමාණ වලට අසුරන ලද මෙම ද්‍රව්‍ය කොළඹ, නාරාහේන්පිට කෘෂිකර්ම මධ්‍යම ගබඩාවට ගෙන ගොස් බාර දිය හැකි මිළ සඳහන් කරන ලෙස ටෙන්ඩර්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ :—

| කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය විස්තර | අසුරන ලද ප්‍රමාණය | අවශ්‍ය වෙතැයි සිතන ප්‍රමාණය |
|---|---|---|
| 3–4 ඩයික්ලෝරෝ ප්‍රෝපිනනිලයිඩ් (ඩීපීඒ) ... ... | ක්‍රියාකාරී මූල ද්‍රව්‍ය රාත්තල් 1¼ක් ඇති ටින්වල ... | ටින් 1,500 |

2. කොළඹ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අතිරේක ආහාර බෝග) ගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල අනු පිටපතක් ද සහිතව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් එවන සැම ටෙන්ඩරයක්ම කොළඹ ඩියුක් වීදියේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට යැවිය යුතු අතර ටෙන්ඩර් බහාලන කවරයේ වම්පස මුදුන් කෙළවර "කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

3. මේ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කිරීම හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කිරීම කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ''කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර'' යනුවෙන් ද සඳහන් කොට මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් ටෙන්ඩර් බාර ගැනීමට බලය ලත් නිලධාරි තැන වූ කොළඹ, ඩියුක් වීදියේ කෘෂිකර්ම දපාර්තමේන්තුවේ, පරිපාලන නිලධාරි (ව්‍යාප්ති) වෙත පෞද්ගලිකව බාරදී ලැබුනු බවට කුවිතාන්සියක් ලබා ගත යුතුය. එවනු ලබන ටෙන්ඩර් පත්‍ර වල, ඒ සඳහා සපයා ඇති ස්ථානයෙහි ටෙන්ඩර්කරු විසින් යථා පරිදි අත්සන් කරන ලද, ටෙන්ඩර් කොන්දේසිවල පිටපතක් ද තිබිය යුතුය.

4. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම්, ඔවුන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කරන වේලාවෙහි පැමිණ සිටීමට හෝ ඒ වේලාවෙහි තම තමන්ගේ ටෙන්ඩර් පත්‍ර වල අනු පිටපත් පරීක්ෂා කර බැලීමට අවසර දෙනු ලැබේ. කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී, ටෙන්ඩර් බාර ගැනීමේ අවසාන යටකී දින, යටකී වේලාවට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

5. ටෙන්ඩරයකට රුපියල් 10 බැගින් තැන්පත් කළ බවට ඉදිරිපත් කරන කුවිතාන්සි මත 1964.12.18 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. කොළඹ මහා භාණ්ඩාගාරයෙහි, තමන් කැමැති කච්චේරියක හෝ පේරාදෙනියේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි මෙම මුදල තැන්පත් කළ යුතුය.

6. නියමිත ෆෝර්මයේ නොලියන ලද, හා එහි නියමිත කොන්දේසිවලට සම්පූර්ණයෙන් අනුකූල නොවන කිසිම ටෙන්ඩරයක්, ටෙන්ඩරයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් මෙන්ම, යම්කිසි වෙනස් කිරීමක් හෝ මැකීමක් ඇතොත් එතැනට ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යෙදිය යුතුය. ඉදිරිපත් කරන මිළ ගණන් අකුරෙන් මෙන්ම ඉලක්කම් වලින් ද දැක්විය යුතුය. වචනයෙන් සඳහන් කළ මුදල ඉලක්කම් වලින් දක්වා ඇති මුදලට වෙනස් නම් ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ සම්පූර්ණ ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කළ යුතුය.

8. ඉහත පළවෙනි වගන්තියෙහි දක්වා ඇති ද්‍රව්‍ය සියල්ලම හෝ ඉන් කොටසක් වෙනුවෙන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ටෙන්ඩර්කරුවන්ට නිදහස තිබේ.

9. යම් ටෙන්ඩර්කරුවෙකුගේ ටෙන්ඩරය පිළිගත් බව දන්වා සති දෙකක් ඇතුළත අවශ්‍යව ඇති කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය සැපයීමට ටෙන්ඩර්කරුට හැකි විය යුතුය. මෙම කාලය තුළදී සැපයීම් කළ නොහැකි වුවහොත් එම කාලය ඉකුත්වා සැපයීම ප්‍රමාදවන සෑම සතියකටම රු. 50 බැගින් අලාභ ගෙවීමට කොන්ත්‍රාත්කරුට සිදු වේ. මෙම තත්වයන් යටතේ ටෙන්ඩර්කරුට සැපයීමට නොහැකි වන සැපයීම්, ටෙන්ඩර් කරුගේ වියදමින් වෙනත් වෙළඳුන්ගෙන් ලබා ගැනීමේ අයිතිය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතුවේ. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස නිම කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වන අතර, ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි ඇතුළත් කිරීමට ද ඉඩ තිබේ.

10. ඉහත සඳහන් තොගය මුළුමනින්ම ඇණවුම් කරන බවට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සහතික නොවන අතර, ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ සමහර ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, කිසියම් ටෙන්ඩරයක කොටසක් පිළි ගැනීමේත්, අවශ්‍ය ප්‍රමාණයන් ගෙන් ඇනවුම් කිරීමේත් අයිතිය ඔහු සතු වෙනවා ඇත.

11. දෙපාර්තමේන්තුවේ යහපත සඳහා කොන්ත්‍රාත්තුවේ සඳහන් කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය තොගය මුළුමනින්ම මිළට නොගත යුතු යැයි කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට පෙනී ගියහොත් එසේ මිළට නොගැනීම හේතු කොට ගෙන ආණ්ඩුවෙන් වන්දි මුදලක් ලබා ගැනීමට බලයක් කොන්ත්‍රාත්කරුවාට නොලැබේ.

12. ටෙන්ඩර් කරන ලද මෙහෙය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් යෙදවීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවේ. ටෙන්ඩර් කිරීමෙන් භාරගත් කාර්යය නිම කිරීමට ලාංකික කම්කරුවන් යෙදවීම කොන්ත්‍රාත්තුවෙහි කොන්දේසියක් වන අතර, පිළිගත් ටෙන්ඩර්කරු විසින් මෙම කොන්දේසිය පැහැර හැරීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කිරීමක් ලෙස සලකා කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතු වනු ඇත. එසේ වෙතත් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව, ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් කොන්ත්‍රාත්කරුට බලය දීමට ඉඩ ඇති නමුත්, එසේ ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට ප්‍රථම කොන්ත්‍රාත්කරු විසින් කෘෂිකර්ම අධ්‍යක්ෂගෙන් ලියවිල්ලකින් බලය ලබා ගෙන එසේ කළ යුතුය. එවැනි අනුදැනීමකින් හා සම්මුතියකින් තොරව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි පැහැර හැරීමක් ලෙස සලකනු ලැබේ.

''ලාංකික'' යන්නෙහි අර්ථය, පෙලපතින් හෝ ලියා පදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියෙකු වීම වශයෙන් සලකනු ලැබේ.

13. වර්ෂ 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි අධිකාරය) යටතෙහි නම් සේවකයකු විසින් හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා සිටි විට කොන්ත්‍රාත්කරු විසින් එම වන්දිය රජයෙන් ඉල්ලා සිටිය යුතු නොවේ.

14. කොන්ත්‍රාත්කරුට බාරදීමට ඇති සියළුම දැන්වීම් ඔහුට හෝ ඔහුගේ නියෝජිතයාට (සමාගමක් නම් එම සමාගමේ නියෝජිතයා හෝ ලේකම්වරයා ඇතුළුව) බාර දුනහොත් කාර්යාලය හෝ පදිංචි ස්ථානය හෝ වේවා, මේ සඳහා ටෙන්ඩර්කරු විසින් තෝරා ගන්නා ස්ථානයට තැපෑලෙන් යැවුවහොත් ඒවා ඔහු අතටම බාර දුන්නායේ සලකනු ලැබේ. කොන්ත්‍රාත්කරු විසින් තමාගේ කාර්යාලය හෝ පදිංචි ස්ථානය වෙනස් කරන්නේ නම් එවැනි වෙනසක් ඇති වූ බව කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා වෙත නොපමාව ලියවිල්ලකින් දන්විය යුතුය. කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා වෙත එවැනි ලිඛිත දැන්වීමක් කරන තුරු, ලියුම්, දැන්වීම් හා අනිකුත් ලියකියවිලි ආදිය දී ඇති ලිපිනයට තැපැල් කර හැරීම ඔහු අතට බාරදීමක් ලෙස සියලුම කාර්යයන් උදෙසා සලකනු ලැබේ.

15. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සලකා ඊට විරුද්ධවීමේ අයිතිය රජය සතු වන්නේය.

16. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන අයකුගේ නම සමඟ හෝ ඇතුළත්ව හෝ තමාට සැහේයයි හැඟී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධ වන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැදෙනු නොලැබේ.

17. ටෙන්ඩර්කරු විසින් දක්වන මිළ ගණන්, ටෙන්ඩර් බාර ගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් සති තුනක් තුළවත් පිළි ගැනීමට තරම් ස්ථිර විය යුතුය.

18. කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය සැපයීම අසතුටුදායක නම හෝ කොන්ත්‍රාත්තුවෙහි කොන්දේසි පැහැර හැරීම නිසා කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතිය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේය.

19. වැඩි විස්තර අසා එවන ලිපි කොළඹ 1, ඩියුක් වීදියේ, තැ.පෙ. 536, බී.එස්.එස්.අයි. ගොඩනැගිල්ලේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අතිරේක ආහාර බෝග) වෙත එවිය යුතුය.

ඒ. ටී. එම්. සිල්වා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1964 නොවැම්බර් මස 30 දින,
කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

12-201—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොලිතීන් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් ප්‍රමාණවල පොලිතීන් නාරාහේන්පිට කෘෂිකර්ම මධ්‍යම ගබඩාවට සැපයීම සඳහා 1964 දෙසැම්බර් 18 දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

පොලිතීන් නාලාකාර (Tubular Film)
රාත්තල් 10,000

පොලිතීන් කවර. (Bags)

| ගේජ් | දිග පළල | අවශ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 300 | 14″ × 8″ | 2,000 |
| 300 | 10″ × 5″ | 3,000 |
| 150 | 9 × 6 | 15,000 |
| 100 | 14 × 12 | 20,000 |
| 150 | 10 × 6 | 5,000 |
| 500 | 12 × 8 | 10,000 |
| 350 | 9 × 14 | 50,000 |
| 150 | 6 × 4 | 2,000 |
| 150 | 6 × 8 | 5,000 |
| 150 | 8 × 10 | 2,000 |
| 500 | 6 × 5 | 15,000 |
| 250 | 12 × 6 | 10.000 |
| 250 | 6 × 4 | 5,000 |
| 250 | 12 × 4 | 5,000 |
| 250 | 6 × 12 | 7,000 |

ඉහත සඳහන් පොලිතීන් තොගය 1965 සැප්තැම්බර් 30 වෙනිද දක්වා කාලයට අවශ්‍ය වන ප්‍රමාණය හෙයින් කෘෂිකර්ම මධ්‍යම ගබඩාවේ සම්බන්ධතා නිලධාරි තැන විසින් නියම කරන පරිදි ඒ ඒ කාල සීමා වල දී කොටස් වශයෙන් සැපයීමට ටෙන්ඩර් කරුවන් සූදනම් විය යුතුයි.

2. කොළඹ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අතිරේක ආගාර බෝග) ගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍ර වල අනු පිටපතක් ද සහිතව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් එවන සෑම ටෙන්ඩරයක් ම කොළඹ ඩියුක් වීදියේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට යැවිය යුතු අතර ටෙන්ඩර් බහාලන කවරයේ වම්පස මුදුනේ කෙළවර ''පොලිතීන් සැපයීම සඳහා ටෙන්ඩර්'' යනුවෙන් සඳහන් කළ යුතුය.

3. ඉම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කිරීම හෝ ලියා පදිංචි කළ තැපැලෙන් ඉදිරිපත් කිරීම කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කල තැපැලෙන් නොඑවන්නේ නම් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ''පොලිතීන් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර'' යනුවෙන් ද සඳහන් කොට මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් ටෙන්ඩර් බාර ගැනීමට බලය ලත් නිලධාරි තැන වූ කොළඹ, ඩියුක් වීදියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පරිපාලන නිලධාරි (ව්‍යාප්ති) වෙත පෞද්ගලිකව බාර දී ලැබුනු බවට කුවිතාන්සියක් ලබා ගත යුතුයි. එවනු ලබන ටෙන්ඩර් පත්‍ර වල, ඒ සඳහා සපයා ඇති ස්ථානයෙහි ටෙන්ඩර්කරු විසින් යථා පරිදි අත්සන් කරන ලද, ටෙන්ඩර් කොන්දේසිවල පිටපතක් ද තිබිය යුතුය.

4. ටෙන්ඩර්කරුවන්ට ළවමනා නම්, ඔවුන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ටෙන්ඩර් විවෘත කරන වේලාවෙහි පැමිණ සිටීමට හෝ ඒ වේලාවෙහි තම තමන්ගේ ටෙන්ඩර් පත්‍රවල අනු පිටපත් පරීක්ෂා කර බැලීමට අවසර දෙනු ලැබේ. කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී, ටෙන්ඩර් බාර ගැනීමේ අවසාන යට කී දින, යට කී වේලාවට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

5. ටෙන්ඩරයකට රුපියල් 100 බැගින් තැන්පත් කළ බවට ඉදිරිපත් කරන කුවිතාන්සිය මත 1964.12.18 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. කොළඹ මහා භාණ්ඩාගාරයෙහි, තමන් කැමති කච්චේරියක හෝ පේරාදෙනියේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි මෙම මුදල තැන්පත් කළ යුතුය.

6. නියමිත පෝර්මයේ නොලියන ලද හා එහි නියමිත කොන්දේසි වලට සම්පූර්ණයෙන් අනුකූල නොවන කිසිම ටෙන්ඩරයක්, ටෙන්ඩරයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් මෙන්ම, යම්කිසි වෙනස් කිරීමක් හෝ මැකීමක් ඇතොත් එතැනට ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යෙදිය යුතුය. ඉදිරිපත් කරන මිළ ගණන් අකුරෙන් මෙන්ම ඉලක්කම් වලින් ද දැක්විය යුතුය. වචනයෙන් සඳහන් කළ මුදල ඉලක්කම් වලින් දක්වා ඇති මුදලට වෙනස් නම් ටෙන්ඩරය ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ සම්පූර්ණ ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් කළ යුතුය.

8. ඉහත පළවෙනි වගන්තියේ දක්වා ඇති ද්‍රව්‍ය සියල්ලම හෝ ඉන් කොටසක් වෙනුවෙන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ටෙන්ඩර්කරුවන්ට නිදහස තිබේ.

9. යම් ටෙන්ඩර්කරුවෙකුගේ ටෙන්ඩරය පිළිගත් බව දන්වීමෙන් පසුව අවශ්‍යතාවයන්ට අනුව ඒ ඒ දිනවලදී පොලිතීන් සැපයීමට ටෙන්ඩර්කරුට හැකි විය යුතුය. නියමිත කාලය තුළ දී සැපයීම් කළ නොහකි වුවහොත් එම කාලය ඉක්මවා සැපයීම් ප්‍රමාද වන සෑම සතියකටම රු. 50 බැගින් අලාභ ගෙවීමට කොන්ත්‍රාත් කරුට සිදු වේ. මෙම තත්ත්වයන් යටතේ ටෙන්ඩර්කරුට සැපයීමට නොහැකි වන සැපයීම්, ටෙන්ඩර්කරුගේ වියදමින් වෙනත් වෙළෙන්දන්ගෙන් ලබා ගැනීමේ අයිතිය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතුවේ. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව සතුටු දයක ලෙස නිම කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ ඇප මුදල රාජ සන්තක වන අතර, ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි ද ඇතුළත් කිරීමට ඉඩ තිබේ.

10. ඉහත සඳහන් තොගය මුළු මනින් ම ඇණවුම් කරන බවට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සහතික නොවන අතර. ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ සමහර ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, කිසියම් ටෙන්ඩරයක කොටයක් පිළිගැනීමේත්, අවශ්‍ය ප්‍රමාණයන් ගෙන් ඇනවුම් කිරීමේත් අයිතිය ඔහු සතු වෙනවා ඇත.

11. දෙපාර්තමේන්තුවේ යහපත සඳහා කොන්ත්‍රාත්තුවේ සඳහන් පොලිතීන් තොගය මුළුමනින් ම මිළට නොගත යුතුයයි කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාට පෙනී ගියහොත් එසේ මිළට නොගැනීම හේතු කොට ගෙන, ආණ්ඩුවෙන් වන්දි මුදලක් ලබා ගැනීමට බලයක් කොන්ත්‍රාත්කරුවාට නො ලැබේ.

12. ටෙන්ඩර් කරන ලද මෙහෙය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් යෙදීමට පිලිගත් ටෙන්ඩර්කරුට සිදු වේ. ටෙන්ඩර් කිරීමෙන් භාර ගත් කාර්යය නිම කිරීමට ලාංකික කම්කරුවන් යෙදවීම කොන්ත්‍රාත්තුවෙහි කොන්දේසියක් වන අතර, පිළිගත් ටෙන්ඩර්කරු විසින් මෙම කොන්දේසිය පැහැර හැරීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කිරීමක් ලෙස සලකා කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතුවනු ඇත. එසේ වෙතත් විශේෂ අවස්ථාවල දී කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ සම්මුතිය ඇතිව, ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයා විසින් කොන්ත්‍රාත්කරුට බලය දීමට ඉඩ ඇති නමුත්, එසේ ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට ප්‍රථම කොන්ත්‍රාත්කරු විසින් කෘෂිකර්ම අධ්‍යක්ෂ ගෙන් ලියවිල්ලකින් බලය ලබා ගෙන එසේ කළ යුතුය. එවැනි අනුදැනීමකින් හා සම්මුතියකින් තොරව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි පැහැර හැරීමක් ලෙස සලකනු ලැබේ.

''ලාංකික'' යන්නෙහි අර්ථය, පෙලපතින් හෝ ලියා පදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියකු වීම වශයෙන් සලකනු ලැබේ.

13. වර්ෂ 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත (117 වැනි අධිකාරය) යටතෙහි යම් සේවකයකු විසින් හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා සිටි විට කොන්ත්‍රාත්කරු විසින් එම වන්දිය රජයෙන් ඉල්ලා සිටිය යුතු නොවේ.

14. කොන්ත්‍රාත්කරුට බාර දීමට ඇති සියළුම දැන්වීම් ඔහුට හෝ ඔහුගේ නියෝජිතයාට (සමාගමක් නම් එම සමාගමේ නියෝජිතයා හෝ ලේකම් වරයා ඇතුළුව) බාර දුනහොත් කාර්යාලය හෝ පදිංචි ස්ථානය හෝ වේවා, මේ සඳහා ටෙන්ඩර්කරු විසින් තෝරා ගන්නා ස්ථානයට තැපැලෙන් යැවුවහොත් ඒවා ඔහු අතටම භාර දුන්නා සේ සලකනු ලැබේ. කොන්ත්‍රාත් කරු විසින් තමාගේ කාර්යාලය හෝ පදිංචි ස්ථානය වෙනස් කරන්නේ නම් එවැනි වෙනසක් ඇති වූ බව කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා වෙත නොපමාව ලියවිල්ලකින් දැන්විය යුතුය. කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයා වෙත එවැනි ලිඛිත දැන්වීමක් කරන තුරු, ලියුම්, දැන්වීම්, හා අනිකුත් ලියකියවිලි ආදිය දී ඇති ලිපිනයට තැපැල් කර හැරීම ඔහු අතට ම බාර දීමක් ලෙස සියලුම කාර්යයන් උදෙසා සලකනු ලැබේ.

15. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සලකා ඊට විරුද්ධවීමේ අයිතිය රජය සතු වන්නේ ය.

16. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳව ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන අයකුගේ නම සමඟ හෝ ඇතුළත්ව හෝ තමාට සැහේ යයි හැඟී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධ වන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නො ලැබේ.

17. ටෙන්ඩර්කරු විසින් දක්වන මිළ ගණන්, ටෙන්ඩර් බාර ගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් සති තුනක් තුලවත් පිළිගැනීමට තරම් ස්ථිර විය යුතුය.

18. පොලිතීන් සැපයීම අසතුටුදයක නම් හෝ කොන්ත්‍රාත්තුවෙහි කොන්දේසි පැහැර හැරිම නිසා කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතිය කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයා සතු වන්නේ ය.

19. වැඩි විස්තර අසා එවන ලිපි නාරාහේන්පිට කෘෂිකර්ම මධ්‍යම ගබඩාවේ සම්බන්ධතා නිලධාරි වෙත එවිය යුතුය.

ඒ. ටී. එම්. සිල්වා,
කෘෂිකර්ම අධ්‍යක්ෂක.

1964 නොවැම්බර් මස 30 දින,
කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

12–200—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**ධර්ම පුරම් ව්‍යාපාරයේ පොදු ගොඩනැගිලි තැනීම සඳහා ටෙන්ඩර්**

යාපනය දිස්ත්‍රික්කයේ කිලිනොච්චි ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ධර්ම පුරම් ව්‍යාපාරයේ පහත සඳහන් පොදු ගොඩනැගිලි තැනීම සඳහා ටෙන්ඩර් ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1964.12.29 දින පෙරවරු 10.00 තෙක් භාරගනු ලැබේ.

මධ්‍යම බෙහෙත් ශාලා 1
ඇපොතිකරිගේ නිවාස 1
වින්නඹුමාතා නිවාස 1
ළිං 2
අවශ්‍ය වැටවල් හා ගේට්ටු

2. ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ෆෝර්මයක අනු පිටපතකුත් සමඟ ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1964 දෙසැම්බර් මස 29 වැනි අඟහරුවාදා පෙ. ව. 10ට කොළඹ මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

3. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ රු. 50,000කට හෝ වැඩියෙන් ලියා පදිංචි වූ ටෙන්ඩර්කරුවන්ට පමණක් 1964 දෙසැම්බර් මස 24 වෙනි දින දාවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. මෙම දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ ලංකා බැංකු කාර්යාලයේ (යෝර්ක්) වීදියේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීම මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් ලබා ගැනීමට මත්තෙන් තමාගේ ලියාපදිංචිය දැක්වෙන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.

4. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැනගෙන් විමසන්න.

සී. ද පොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

1964 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ 1, එච්ලන් චතුරශ්‍රය,
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දී ය.

12-237—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**ඌරුගොඩවත්ත දැව ගබඩාවෙහි දැව අඩුක්කු කිරීමේ මඩු තැනීම**

කොළඹ 1 ඒ/2 අවිස්සාවේල්ල පාර, වැල්ලම්පිටියේ පිහිටි ඌරුගොඩවත්ත දැව ගබඩාවෙහි දැව අඩුක්කු කිරීමේ මඩු හතරක් තැනීම සඳහා කොළඹ තැ.පෙ. 509 දරණ තැන වන සංරක්ෂක විසින් 1965 ජනවාරි මස 5 වන අඟහරුවාදා පෙ.ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. කොළඹ 2, කිව් පාරේ වන සංරක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මත ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන්නේ ලංකා බැංකුවේ, කොළඹ යෝර්ක් වීදියේ ශාඛාවේ හෝ ඕනෑම කච්චේරියකදී හෝ වන සංරක්ෂකගේ වාසියට එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 50 ක මුදලක් තැන්පත් කර, ඒ සඳහා කාර්යාලයීය කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසුවය. 1965 ජනවාරි මස 4 වෙනි දින ප.ව. 4 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

4. සැලැස්ම සහිත වැඩි විස්තර, කොළඹ 2 කිව් පාරේ වන සංරක්ෂකගෙන් ලබාගැනීමට පුළුවන.

කේ. ගනේෂන්,
වැඩ බලන වන සංරක්ෂක වෙනුවට.

1964 නොවැම්බර් මස 30 දින,
කිව් පාර, කොළඹ 2,
වන සංරක්ෂණ කාර්යාලයය,

12-236—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

කොළඹ, මහලේකම් කාර්යාලයෙහි පිහිටි, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට දැව පදම් කිරීමේ උඳුන් 5ක් සැපයීම, සවිකිරීම සහ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වර්ෂ 1965ක් වූ පෙබරවාරි මස 23 වෙනි අඟහරුවාදා පෙරවරු 10.00 දක්වා ටෙන්ඩර් අයදුම්පත්‍ර භාරගනු ලැබේ.

2. කොළඹ, කිව්පාරේ, පිහිටි වන සංරක්ෂක තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්ම අනු පිටපතක් ද සහිතව එව්ය යුතුයි.

3. සෑම ටෙන්ඩර් අයදුම් පතක් සම්බන්ධයෙන්ම රු. 250ක ඇප මුදලක් වන සංරක්ෂක තැනගේ නමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකුවේ හෝ වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ටෙන්ඩර් අයදුම්පත් ලබාගැනීමේදී ඉදිරිපත් කළයුතුයි. වර්ෂ 1965 පෙබරවාරි 22 වෙනි දින දවල් 12.00 වනතුරු ටෙන්ඩර් අයදුම් පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි සහ වැඩි විස්තර වන සංරක්ෂක තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි.

කේ. ගනේෂන්,
වැඩ බලන වන සංරක්ෂක වෙනුවට.

කොළඹ 2,
1964 දෙසැම්බර් මස 4 දින,

12-230—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

**කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම**

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1965 ජනවාරි 1 වනද සිට 1965දෙසැම්බර් 31 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමු වන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (1) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරණ ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ එවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(2) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් ක ළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එව්ය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එව්ය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡේදයේ (2) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු ආන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී වෙත" ට කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරනලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිත යෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුව ය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි "ඩී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරණ මිළ ගණන් සඳහන් කළ යුතු යි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරණ විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩරකරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගෙ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටිපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

ජේ. ආර්. සී. තම්බිමුත්තු,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1964.11.26
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දීය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: මාළු | සේවකයින්ට: මස් | සේවකයින්ට: කරවල | සේවකයින්ට: එළවළු | නොගෙවන රෝගීන්ට: මාළු | නොගෙවන රෝගීන්ට: මස් | නොගෙවන රෝගීන්ට: කරවල | නොගෙවන රෝගීන්ට: එළවළු | කිරි ආහාර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් | රුපියල් | | | | | | | | | | |
| අත්තනකඩවල මාතෘ නිවාසය | ... 100 | ... 300 | | ... 350... | 300... | 350... | 1,100... | 500... | 325... | 500... | 1,550... | — |
| බී.ඕ.පී. 400 පොළොන්නරුව ග්‍රාමීය රෝහල ... | ... 100 | ... 400 | | ... 470... | 450... | 450... | 1,850... | 1,150... | 1,150... | 1,150... | 4,600... | — |
| යටවත්ත මාතෘ නිවාසය | ... 100 | ... 300 | | ... 150... | 150... | 200... | 600... | 650... | 600... | 700... | 2,600... | — |
| ගිරිතලේ මාතෘ නිවාසය | ... 100 | ... 300 | 1964.15.12 | ... 200... | — ... | 400... | 800... | 600... | — ... | 1,100... | 2,400... | — |
| මනම්පිටිය මාතෘ නිවාසය | ... 100 | ... 300 | වැනි දින | ... 250... | — ... | 250... | 1,200... | 300... | — ... | 300... | 1,500... | — |
| මාතලේ (උතුර) මාතෘ නිවාසය | ... 100 | ... 400 | පෙරවරු 10 ට | ... 200... | 200... | 210... | 800... | 710... | 700... | 700... | 2,800... | — |
| ඔවිලිකන්ද මාතෘ නිවාසය | ... 100 | ... 400 | | ... 300... | 300... | 300... | 1,200... | 330... | 350... | 350... | 1,300... | — |
| ඉලුක්කුඹුර මාතෘ නිවාසය | ... 100 | ... 300 | | ... 150... | — ... | 150... | 700... | 200... | — ... | 200... | 1,000... | — |
| දේවහූව මාතෘ නිවාසය | ... 100 | ... 300 | | ... 100... | 100... | 100... | 100... | 100... | 100... | 100... | 500... | — |

12-164—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**කුරුණෑගල කොට්ඨාශය—කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම**

1964.10.30 වෙනි දින අංක 14,211 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කර ඇති දැන්වීම අනුව පහත නම් සඳහන් ආයතන පහ සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය 1964.12.17 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10 දක්වා දීර්ඝ කර ඇති බැව් මෙයින් දන්වමි.

එච්. ඒ. ජේසුදාසන්,
වැඩ බලන සෞඛ්‍ය සේවා අධිකාරී
කුරුණෑගල.

1964 නොවැම්බර් 27 දින,
කුරුණෑගල,
සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දීය.

### ආයතනය

දූනකදෙනිය මාතෘ නිවාසය

කොබෙයිගනේ මාතෘ නිවාසය

මූනමල්දෙණිය මාතෘ නිවාසය

මුරුතැන්ගේ මාතෘ නිවාසය

සද ලංකාව මාතෘ නිවාසය.

12-176—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

යොමු අංකය : එෆ්.ටී.සී. 62/64

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### පෝලියෝ වැක්සින් සැපයීම සඳහා ටෙන්ඩර්

1. මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනට පෝලියෝ වැක්සින් සැපයීම සඳහා එවන ටෙන්ඩර්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1965 මාර්තු 2 වෙනි අඟහරුවාදා උදේ 10 දක්වා බාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුවේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ඩීන්ස් පාරේ 355 දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශයෙන්) ලබා ගත හැක. මෙම දැන්වීමේ 5 වැනි, 6 වැනි ඡෙදයන්හි සඳහන් කරුණු අනුව 1965 මාර්තු 1 වෙනි සඳුද උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත් සීල් තබන ලද කවරයක බහා, සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ. පෙ. 500, පළමු වෙනි මහළ මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලුමුවදෙර, කොළඹ යන ලිපිනයට එවිය යුතුවේ. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ " පෝලියෝ වැක්සින් ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්, 1965 මාර්තු 2 උදේ 10 ට " යනුවෙන් සඳහන් කළ යුතුවේ.

4. ටෙන්ඩර් පත් ගාලු මුවදෙර මහාලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ, කාමර අංක 155 හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍යයයි හැඟේ නම් සීල් තබන ලද ටෙන්ඩර්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උප ලේකම් තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීම ද කළ හැක. එසේ බාර දෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහා ද යන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුවේ. එම ටෙන්ඩර් පත් බාර ගැනීම සඳහා ඉහතකී නිලධාරි තැනට බලය ඇත. සීල් තබන ලද ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර් කරුවෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුව ද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්ත වරයෙකු බව සහතික කළ යුතුවේ. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතුවේ.)

6. 1955 ඔක්තෝබර් 28 වෙනි දින අංක 10,854 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් අයුරු, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1949 සහ අංක 25 දරණ ආහාර සහ ඖෂධ පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව, ඖෂධ විකිණීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගෙන් ලබාගත් වලංගු බල පත්‍රයක් ඇති, බලය ලත් වෙළඳුන්ගෙන් පමණක් මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්මේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහ ආණ්ඩුව, චෙකොස්ලොවැකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය. කොරියාව, පෝලන්තය, රුමේනියාව මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලේවියාව, වියට් නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව ආදී රටවලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් වෙතොත්, ඔවුන් ලියා පදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තන් විය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේ දී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතු වේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වැනි ඡෙදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශය) ලබාගත හැක. මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිත කළ හැක්කේ ස්වදේශීය ටෙන්ඩර් කරුවන්ට පමණි.

8. මෙහි පළමුවැනි ඡෙදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාර ගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2 ක් වත් විවෘතව තැබිය යුතුයි.

9. කෙලින් ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිෂ්පාදක මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියලුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකා ආණ්ඩුවේ නියෝජිතයින්ගෙන් ලබාගත හැකි බව දැන්විය යුතුවේ. මහා බ්‍රිතාන්‍ය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්ථානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම, හන්ගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාලදිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාව, බොම්බායේ සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නිහි සිටින ලංකා වෙළඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයින්ගෙන්.

10. මෙහි 1 වැනි ඡෙදයේ සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර් කරුවෙකුටම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිල ගණන් එහි පැමිණි සිටි ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුන ටෙන්ඩර යක් පරීක්ෂා කර බැලීමට යම්කිසි ටෙන්ඩර් කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

ඇස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ,
1964 ඔක්තෝබර් 31.

### අදාල උප ලේඛනය

| ද්‍රව්‍ය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතාවයන් | අවශ්‍ය ඇසිරීම |
|---|---|---|---|
| 1. | ඔරල් මැග්නීසියම් ක්ලෝරයිඩ් ස්ටැබලයිස්ට් ද්‍රව පෝලියෝ වැක්සීන් කුප්පි තුල සෑම කුප්පියක් තුළම ඩෝසස් 10 ක් අඩංගු විය යුතුය ... ... | 2,50,000 ක් ඩෝසස් | පහසු ආකාරයක ඇසිරීමක් |

**භාරදීමේ කොන්දේසි.**—සම්පූර්ණ ප්‍රමාණයම, සුදුසු ආකාරයට අසුරා සීතකර තුළ බහා, එකම තොගයකින් ඇනවුම් කරන ලද දිනයේ සිට තෙමසක් ඇතුළත කොළඹ, රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් බාර දිය යුතුය.

2. ටෙන්ඩර්කරු ණයවර ලිපියක් ස්ථාපනය කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම්, මිල සහ කොළඹට ගෙන ඊමේ ගාස්තු හා ඇසිරීම් හා අනිකුත් සියලුම වියදම් සහිතව මිල, භාණ්ඩ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් ද සඳහන් කළ යුතු වෙයි. නැව් මාරුවට අවසර නොලැබේ.

3. සියළුම භාණ්ඩ හා ඒවා බහා එවන සියළුම භාජනවල " ඔටුන්න ලකුණ " හා එස්/සීඑම්එස් 2404/64-65 යනුවෙන් සඳහන් කළ යුතුය.

12–178—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

යොමු අංකය : එෆ්.ටී.සී. 52/64

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### පෙනෙක්සිමෙතිල් පෙනිසිලින් පැණි ආදිය සැපයීම

1. මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනට පෙනෙක්සිමෙතිල් පෙනිසිලින් පැණි ආදිය සැපයීම සඳහා එවන ටෙන්ඩර්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1965 මාර්තු 16 වෙනි අඟහරුවාද උදේ 10 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුවේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ඩීන්ස් පාරේ 355 දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්‍යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශයෙන්) ලබාගත හැක. මෙම දැන්වීමේ 5 වැනි, 6 වැනි ඡේදයන්හි සඳහන් කරුණු අනුව 1965 මාර්තු 15 වෙනි සඳුද උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත් සීල් තබන ලද කවරයක බහා, සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ. පෙ. 500, පළමු වෙනි මහළ, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලුමුවදෙර, කොළඹ යන ලිපිනයට එවිය යුතුවේ. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ '' පෙනෙක්සිමෙතිල් පෙනිසිලින් පැණි ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්, 1965 ජනවාරි 16 උදේ 10 ට '' යනුවෙන් සඳහන් කළ යුතු වේ.

4. ටෙන්ඩර් පත් ගාලු මුවදෙර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ, කාමර අංක 155 හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියා පදිංචි කළ තැපැලෙන් එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍යයයි හැඟේ නම් සීල් තබන ලද ටෙන්ඩර්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උප ලේකම් තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීම ද කළ හැක. එසේ බාර දෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහා ද යන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුවේ. එම ටෙන්ඩර් පත් බාර ගැනීම සඳහා ඉහතකී නිලධාරී තැනට බලය ඇත. සීල් තබන ලද ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර් කරුවෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුව ද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්තවරයෙකු බව සහතික කළ යුතුවේ. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතුවේ).

6. 1955 ඔක්තෝබර් 28 වෙනි දින අංක 10,854 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් අයුරු, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1949 සහ අංක 25 දරණ ආහාර සහ ඖෂධ පනත යටතේ පනවනලද රෙගුලාසි අනුව, ඖෂධ විකිණීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගෙන් ලබාගත් වලංගු බලපත්‍රයක් ඇති, බලය ලත් වෙළඳුන්ගෙන් පමණක් මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්බේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහ ආණ්ඩුව, චෙකොස්ලොවේකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලේවියාව, වියට් නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව ආදී රටවල්වලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් වෙතොත්, ඔවුන් ලියාපදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තන් විය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේ දී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතුවේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වැනි ඡේදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම අංශය) ලබාගත හැක. මෙම කාර්‍යාලයෙන් ලබා ගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිත කළ හැක්කේ ස්වදේශීය ටෙන්ඩර් කරුවන්ට පමණි.

8. මෙහි පළමුවැනි ඡේදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාර ගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2 ක් වත් විවෘත ව තැබිය යුතුයි.

9. කෙලින් ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිෂ්පාදක මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියලුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකා ආණ්ඩුවේ නියෝජිතයින්ගෙන් ලබාගත හැකි බව දැන්විය යුතුවේ. මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකාව එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්ථානය, ජපානය, ප්‍රංශය බටහිර ජර්මනිය, චීන මහජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම, හන්ගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාලදිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාව, බොම්බායේ සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නිහි සිටින ලංකා වෙළඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයින්ගෙන්.

10. ටෙන්ඩර් කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරන ටෙන්ඩර් කොන්දේසිවල 11 වෙනි ඡේදය කෙරෙහි ටෙන්ඩර් කරුවන්ගේ අවධානය යොමු කරණු ලැබේ. කොළඹ රජයේ බෙහෙත් ගබඩා අධිකාරීන්ට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධ විස්තර එම ඡේදයේ සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුයි. ටෙන්ඩර් පත් සමාප්ත කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

11. මෙහි 1 වැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සැම ටෙන්ඩර් කරුවෙකුටම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර් කරුවන්ගේ නම සහ මිල ගණන් එහි පැමිණි සිටි ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුන ටෙන්ඩර් යක් පරීක්ෂා කර බැලීමට යම්කිසි ටෙන්ඩර් කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු එයේ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

ඇස්. බාලක්‍රිෂ්ණන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ,
1964 නොවැම්බර් 28.

### අදල උපලේඛනය

| ද්‍රව්‍ය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතාවයන් | අවශ්‍ය ඇසිරීම |
|---|---|---|---|
| 1 | ෆේනොක්සිමෙතයිල් පෙනිසිලින් පැනි මි. ග්‍රෑ. 125 ක් අඩංගු ෆේනොක්සිමෙතයිල් පෙනිසිලින් 4 මිලි ලිටර්ස් වලින් (ඩ්‍රාච් 1 යි) සැපයීම කුඩු වර්ගයෙන් හෝ අවුන්ස 4 රේ බෝතල් ග්‍රැනුල්ස් වර්ගයෙන් තිබිය යුතු වන්නේ නැවත තන්විකරණ කිරීමෙන් 32 × 125 මි. ග්‍රෑ. මාත්‍රා නිපදවීමටය ... ... ... ... | 750 ඡලුයිඩ් රාත්තල් | අවුන්ස 4 රේ බෝතල් තුළ |

**භාරදීමේ ක්‍රමය.**—විෂයය අංක 1 හි ඇති සම්පූර්ණ තොගය, සමාන තොග හතරකින්, කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් බාර දිය යුතුය. පළමු තොගය ඇනවුම් කළ දින සිට මාස 3 ක් ඇතුළත ද, ඉතිරි තොග තුන, ඉන්පසු එන මාස 3 කට වරක් බැගින් ද සැපයිය යුතුය.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම් මෙම සැපයීමේ සඳහන් කරණ මිල සහ ඇහිරීම් හා අනිකුත් සියළුම වියදම් සහිතව මිල සහ කොළඹට ගෙන ඒමේ ගාස්තුව හා මිල, භාණ්ඩ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් සඳහන් කළ යුතුය.

මෙම සැපයීමේ සැම භාණ්ඩයකම හා ඒවා බහා එවන සැම භාජනයකම '' ඔටුන්න ලකුණ '' හා '' සී/සීඑම් එම්ස් 2338/64–65 '' යනුවෙන් සඳහන් කළ යුතුය.

12–179—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

යොමු අංකය : එෆ්.ටී.බී. 38/64.

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### එක්ස්ට්. ප්‍රො. ටින්ක්ට්. කාර්ඩ් කො. බී. පී. සැපයීම සඳහා ටෙන්ඩර්

1. මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනට එක්ස්ට්ප්‍රොටින්ක්ට් කාර්ඩ් කෝ බී.පී. ආදිය සැපයීම සඳහා එවන ටෙන්ඩර්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1965 මාර්තු 9 වෙනි අඟහරුවාද උදේ 10 දක්වා බාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුවේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ඩීන්ස් පාරේ 355 දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශයෙන්) ලබා ගත හැක. මෙම දැන්වීමේ 5 වැනි, 6 වැනි ඡෙදයන්හි සඳහන් කරුණු අනුව 1965 මාර්තු 8 වෙනි සඳුදා උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත් සීල් තබන ලද කවරයක, බහා, සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ.පෙ. 500, පළමු වෙනි මහල මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලුමුවදොර, කොළඹ යන ලිපිනයට එවිය යුතුවේ. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ එක්ස්ට්. ප්‍රො. ටින්ක්ට්. කාර්ඩ්. කෝ. බී. පී. ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් 1965 මාර්තු 9 උදේ 10 ට " යනුවෙන් සඳහන් කළ යුතුවේ.

4. ටෙන්ඩර් පත් ගාලු මුවදොර මහාලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ, කාමර අංක 155 හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියාපදිංචි කළ තැපැලෙන් එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්, තමන්ට අවශ්‍යයයි හැඟේ නම් සීල් තබන ලද ටෙන්ඩර්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උප ලේකම් තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීම ද කළ හැක. එසේ බාර දෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහා ද යන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුවේ. එම ටෙන්ඩර් පත් බාර ගැනීම සඳහා ඉහතකී නිලධාරි තැනට බලය ඇත. සීල් තබන ලද ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර් කරුවෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුව ද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්ත වරයෙකු බව සහතික කළ යුතු වේ. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතුවේ).

6. 1955 ඔක්තෝබර් 28 වෙනි දින අංක 10,854 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් අයුරු, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1949 සහ අංක 25 දරණ ආහාර සහ ඖෂධ පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව, ඖෂධ විකිණීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගෙන් ලබාගත් වලංගු බල පත්‍රයක් ඇති බලය ලත් වෙළඳුන්ගෙන් පමණක් මෙම සැපයීම සඳහා ටෙන්ඩර් පත් බාරගනු ලැබේ. ලාංකික සම්බන්ධතා ඇති රටවල්වූ ඇල්බේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහ ආණ්ඩුව, චෙකොස්ලොවෙකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව ආදී රටවලින් මෙම සැපයීම් ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් වෙතොත්, ඔවුන් ලියාපදිංචි කරන ලද වෙළන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තන් විය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේ දී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතුවේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අතිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වැනි ඡෙදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධක්ෂක තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශය) ලබාගත හැක. මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිත කළ හැක්කේ ස්වදේශීය ටෙන්ඩර් කරුවන්ට පමණි.

8. මෙහි පළමුවැනි ඡෙදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාවට ටෙන්ඩර් බාර ගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2 ක් වත් විවෘතව තැබිය යුතුයි.

9. කෙලින් ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිෂ්පාදක මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා මෙම ටෙන්ඩර්ය පිළිබඳ සියලුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකා ආණ්ඩුවේ නියෝජිතයින්ගෙන් ලබාගත හැකි බව දැන්විය යුතුවේ. මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්ථානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, හන්ගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාලදිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාව, බොම්බායේ සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නිහි සිටින ලංකා වෙළඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයින්ගෙන්.

10. ටෙන්ඩර් කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරන ටෙන්ඩර් කොන්දේසිවල 11 වෙනි ඡෙදය කෙරෙහි ටෙන්ඩර් කරුවන්ගේ අවධානය යොමු කරණු ලැබේ. කොළඹ රජයේ බෙහෙත් ගබඩා අධිකාරීන්ට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ(සැම්පල්ස්) සම්බන්ධව විස්තර එම ඡෙදයේ සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුයි. ටෙන්ඩර් පත් සමාප්ත කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

11. මෙහි 1 වැනි ඡෙදයේ සඳහන් ස්ථානයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර් කරුවෙකුටම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිල ගණන් එහි පැමිණි සිටි ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුන ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට යම්කිසි ටෙන්ඩර් කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

ඇස්. බාලක්‍රිෂ්ණන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
කොළඹ,
1964 නොවැම්බර් 27.

### අදල විස්තරය

| ද්‍රව්‍ය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතා | අවශ්‍ය ඇසුරුම් |
|---|---|---|---|
| 1 | එක්ස්ට්. ප්‍රො. ටින්ක්ට්. කාර්ඩ්. කො. බී. පී. ටින්ක්චර් කාර්ඩ් කො. බී. පී. ගැලුම් 2,500 ක් නිපදවීමට ... ... ... ... | 2,500 රාත්තල් ... | ප්ලුයිඩ් රාත්තල් 10 යේ බෝතල තුළ |
| 2 | එක්ස්ට්. ප්‍රො. ටින්ක්ට්. ජෙන්ෂන් කො. බී. පී. ටින්ක්චර් ජෙන්ෂන් කො. ප්ලුයිඩ් රාත්තල් 33.333 නිපදවීමට ජාර්ස්වලින්. සෑම ජාරයක්ම ටින්ක්චර් ජෙන්ෂන් කො. බී. පී. වලින් ප්ලුයිඩ් රාත්තල් 500 බැගින් පිළියෙළ කිරීමට සෑහිය යුතු ... | 2,000 රාත්තල් ... | පහසු ඕනෑම ආකාරයක ඇසිරීමක් |
| 3 | එක්ස්ට්. ප්‍රො. එක්ස්ට්. ඉපිකැක් ලික්විඩ් බී. පී. ලික්විඩ් එක්ස්ට් ඉපිකැක් බී. පී. වලින් ප්ලුයිඩ් රාත්තල් 960 නිපදවීමට ... ... ... | 240 රාත්තල් ... | ප්ලුයිඩ් අවුන්ස් 6 යේ බෝතල්වල |
| 4 | එක්ස්ට්. ප්‍රො. ටින්ක්ට්. සින්ජිබ.ෆෝර්ට් බී. පී. ටින්ක්චර් සින්ජිබ් ෆෝර්ටිවලින් ප්ලුයිඩ් රාත්තල් 56,000 ක් නිපදවීමට ... ... ... | 1,400 රාත්තල් ... | රාත්තල් 10 යේ බෝතල්වල |

භාරදීමේ ක්‍රමය.—මෙම සැපයීම් විෂයය අංක 1 සිට 4 දක්වා ඇති සම්පූර්ණ තොගයම ආසන්න සමාන තොග තුනකින් කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් බාර දිය යුතු වෙයි. පළමු තොගය ඇනවුම් කළ දින සිට මාස 3 ක් ඇතුළත ද, ඉතිරි තොග 2 ඉන්පසු එන මාස 3 කට වරක් ද සැපයිය යුතු වෙයි.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම් මෙම සැපයීමේ සඳහන් කරන මිළ සහ ඇහිරීම් හා අතිකුත් සියලුම වියදම් සහිතව මිළ සහ කොළඹට ගෙනඒමේ ගාස්තුව සමග මිල, භාණ්ඩ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් සඳහන් කළ යුතු වෙයි.

මෙම සැපයීමේ සෑම භාණ්ඩයකම සහ ඒවා බහා එවන සෑම භාජනයකම " ඔටුන්න ලකුණ " හා " ජී/සීඑම්එස් 2312/64–65 " යනුවෙන් සඳහන් කළ යුතුය.

12–180—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව-මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

සෞඛ්‍ය අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් නුවරඑළිය රෝහලට කසල කානු තැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1965.1.12 වෙනි කුජදා පෙරවරු 10.00 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7 හි පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කායඝිලයෙන් ලබා ගත හැකි පෝර්මවල, පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1964.12.18 වෙනි සිකුරාදා පස්වරු 4.00 වන තෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන හා/හෝ පල්දෝරු කර්මාන්තයන් සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "බී" කොටස් යටතේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ට පමණී. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන ගේ නමට අයවන ලෙස කොළඹ ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් කොළඹ ගාලු මුවදොර පිහිටි මහ ලේකම් ගොඩ නැගිල්ලේ සෞඛ්‍ය අමාත්‍යාංශ කායඝිලයේ අංක 155 දරන කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියා පදිංචි කළ තැපැලෙන් යැවිය යුතුය. ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ සිටින සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් තැනට භාර දිය හැකිය. සේවයේ විස්තරද ටෙන්ඩර් කරුවන්ගේ නම සහ ලිපිනයද කවරයේ සඳහන් කළ යුතුය. ටෙන්ඩරය භාර ගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

4. පළමුවෙනි ඡේදයේ සඳහන් ස්ථානයේදී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේදී සෑම ඉල්ලුම් කරුවෙකු ටම පෙනී සිටීමට අවසර ලැබෙනවාඇත. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිළ ගණන් ඇමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහිදී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර් කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

5. වැඩය පිළිබඳ වැඩිදුරටත් විස්තර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

ඇස්. ඊ. ජේ. මේතර්,
වැඩ බලන මහජන සෞඛ්‍ය ඉංජිනේරු.

තැ. පෙ. 1434, කොළඹ 7,
1964.11.26.

12-191—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහනුවර සෞ . සේ . අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1965 ජනවාරි 1 වෙනිද සිට 1965 දෙසැම්බර් 31 වෙනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුල මේ සමග ඇති උප ලේඛණයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මහනුවර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උප ලේඛණයෙහි දෙවන තීරයෙහි සඳහන් නියම කරන ලද මුදල් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති හෝ ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම් වලට අයිති සංගම්වලට ද. තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිළි සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, බදුල්ල, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වව්නියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සෑළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (II) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උප ලේඛණයෙහි 5 වෙනි තීරය බලන්න.

5. **ටෙන්ඩර එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී මහනුවර" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත්‍ර බහා එවනා කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිළි ව සඳහන් කළයුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහාන ලද ටෙන්ඩර් පත්‍ර මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දූමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැළැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලික මට හෝ ගණකාධිකාරි ලේකම් තැනට භාරදෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උප ලේඛණයෙහි 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙ.ව. 10.00ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර්යන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ "බී" උප ලේඛණයෙහි සඳහන් ආහාර සැපයීම් සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල් අනුව ය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි "සී" උප ලේඛණයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිල ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම් කරනු ලැබේ.

8. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද ඇමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ දී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනයක මවිසින් හෝ බලය පවරනු ලැබූ මාගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතුව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකි ය.

9. **ටෙන්ඩරයේ සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවෙනි ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නාම් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උප ලේඛණයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතු ය.

11. **බඩු බාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුගේ බඩුබාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුල ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගතයුතුවාක් මෙන් ම පිළිපැදිය යුතුද වන්නේ ය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ටෙන්ඩර්කරුවන් විසින් සැළකිය යුතුය.

ජී. එන්. ආර්. නැතැනියල්,
සෞඛ්‍ය සේවා අධිකාරී, මහනුවර.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
මහනුවර. 1964.11.28

11. ටෙන්ඩර් සඳහා අනිකුත් කොන්දේසි.—ටෙන්ඩර් පත්‍රයෙහි දෙවැනි පිටුවෙහි මේවා සඳහන් වන බැවින් පරීක්ෂාකාරීව කියවා බලා අදාල අවස්ථාවන්හි දී ඒ අනුව ක්‍රියාකල යුතු වේ.

12. ටෙන්ඩර් භාරගැනීම.—(අ) සම්මත ආකෘති පත්‍රයෙහි පිළියෙළ කර නොමැති හෝ.

(ආ) සියළුම ටෙන්ඩර් අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකල හෝ කිසිම ටෙන්ඩරයක් සලකා බලනු නොලැබේ.

කරුනු නොදක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩරයක් මුළුමනින් ම හෝ එහි කොටසක් හෝ භාර ගැනීමේත්, සඳහන් කල කාලයට අඩු කාලයක් සඳහා හෝ භාර ගැනීමේත් අයිතිවාසිකම රජය වෙතම තබාගනු ලැබේ.

## පළමුවන ඡේදයෙහි සඳහන් ආයතනවල, දුම්රිය ස්ථානවල හා බාහිර බඩු ගබඩාවල නාමාවලිය

| ලගම ඇති දුම්රිය ස්ථානය හෝ බාහිර බඩු ගබඩාව | ආයතනයේ නම | දු. ප. හෝ බා.බ.ග සිට දුර | අනුමත කර ඇති දින ගණන |
|---|---|---|---|
| | **"ඒ" කාණ්ඩය** | | |
| මාන්කුලම | කුනුකායි මැදි ඔසුහල | 13 | 1½ |
| | මල්ලාවි මැදි ඔසුහල සහ මාතෘ නිවාසය | 10 | 1½ |
| කිලිනොච්චිය | කිලිනොච්චිය රජයේ රෝහල | ¾ | 1 |
| | වටකච්චිය මැ. ඔ. | 6½ | 1 |
| | වන්නෙරිකුලම් මැ. ඔ. | 21 | 2 |
| පරන්තන්, එලිපන්ට්පාස්, පල්ලෙයි | කන්දවලෙයි මැ.ඔ. | 8 | 1 |
| | එලිපන්ට් පාස් මැ. ඔ. | ¾ | 1 |
| | පල්ලෙයි පර්යන්ත ඒකකය | 1 | 1 |
| | වෙම්පියන් පත්තු ග්‍රාමීය රෝහල | 8 | 1 |
| | මුල්ලියන් මැ. ඔ. | 14 | 1½ |
| කොඩිකාමම් | අම්පන් මැ. ඔ. සහ මා.නි. | 14 | 1½ |
| | කරවෙඩ්ඩි මැ.ඔ. | 9 | 1 |
| | කරවෙඩ්ඩි මා.නි. | 7 | 1 |
| | කොඩිකාමම් මැ. ඔ. සහ මා. නි. | 1½ | 1 |
| | පේද්‍රුරු තුඩුව මැ. ඔ. | 11 | 1 |
| | පේද්‍රුරුතුඩුව ර. රෝ. | 9 | 1 |
| | පේද්‍රුරුතුඩුව සෞඛ්‍ය කාර්යාලය | 11 | 1 |
| | වරනි මැ. ඔ. | 4 | 1 |
| | **"බී" කාණ්ඩය** | | |
| චාවාකච්චේරිය | චාවාකච්චේරිය ර. රෝ. | 1 | 1 |
| | චාවාකච්චේරිය සෞ. කා. | ½ | 1 |
| | පූනාකාරි ප.ඒ. | 14½ | 1 |
| | වේරාවිල් මැ. ඔ. සහ මා. නි. | 36 | 3 |
| නාවත්කුලි, යාපනය | කයිතඩි මැ. ඔ. | ½ | 1 |
| | අනලතිව් මැ. සහ මා. නි. | 23 | 3 |
| | ඩෙල්ෆ්ට් ර. රෝ. | 33 | 3 |
| | කරෙයිනගර් මැ. ඔ. සහ මා. නි. | 13 | 1 |
| | කරෙයියුර් මැ. ඔ. සහ මා. නි. | 2 | 1 |
| | කයිට්ස් ර. රෝ. | 14 | 1 |
| | කයිට්ස් සෞ. කා. | 14 | 1½ |
| | යාපනේ රජයේ මහා රෝහල | 1½ | 1 |
| | යාපනේ සෞ. කා. | 1 | 1 |
| | යාපනේ සෞ. සේ. අධි. කාර්යාලය | 1½ | 1 |
| | යාපනේ බන්ධනාගාර රෝහල | 2 | 1 |
| | යාපනේ බෝවන රෝග රෝහල | 3 | 1 |
| | යාපනේ වාරාය සෞඛ්‍ය කාර්යාලය | 2 | 1 |
| | මන්ඩෙයිතිව් මැ. ඔ. සහ මා. නි. | 7½ | 1 |
| | නයිනාතිව් මැ. ඔ. සහ මා. නි. | 26 | 3 |
| | පුංගුඩුතිව් ර. රෝ. | 20 | 2 |
| | වඩුකොඩ්ඩෙයි ග්‍රා. රෝ. | 8½ | 1 |
| | වේලනේ මැ. ඔ. සහ.මා. නි. | 12 | 1½ |
| කොකුවිල් | කොකුවිල් මැ.ඔ. | ½ | 1 |
| | මානිපායි සෞ. කා. | 4 | 1 |
| | මානිපායි මැ. ඔ. සහ මා. නි. | 3 | 1 |
| | **"සී" කාණ්ඩය** | | |
| ඉනුවිල් | කෝප්පායි ප. ඒ. | 3 | 1 |
| | කෝප්පායි සෞ. කා. | 3 | 1 |
| | උඩුවිල් මැ. ඔ. | 1½ | 1 |
| | ඉනුවිල් මැ. ඔ. | 2 | 1 |
| චුන්නාකම් | අලවෙඩ්ඩි මැ. ඔ. සහ මා. නි. | 3½ | 1 |
| | අච්චුවේලි ග්‍රා. රෝ. | 8 | 1 |
| | වන්කානෙයි ප. ඒ. | 4½ | 1 |
| | චුන්නාකම් | ¼ | 1 |
| | පුන්නාලෙයිකට්ටුවන් මැ.ඔ. | 3 | 1 |
| | පුත්තුර් මැ.ඔ. | 6 | 1 |
| | පණ්ඩතරිප්පු ග්‍රා. රෝ. | 6 | 1 |
| තෙල්ලිපලෙයි | තෙල්ලිපලෙයි සෞ. කා. | 1 | 1 |
| | මයිලිට්ටි මැ. ඔ. | 3¼ | 1 |
| කංකසන්තුරේ | කංකසන්තුරේ ර. රෝ. | 1 | 1 |
| | කංකසන්තුරේ විවේකාගාරය | 2 | 1 |
| | වල්වැට්ටිතුරේ | 10 | 1 |

1964 නොවැම්බර් 26 වන ද,
යාපනේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලය.

වී. සංගරපිල්ලේ,
යාපනේ වැඩ බලන සෞඛ්‍ය සේවා අධිකාරී.

12-211—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### සංගීත භාණ්ඩ අළුත් වැඩියා කිරීම

කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, සැපයීමේ ශාඛාවේ, අධ්‍යාපන අධ්‍යක්ෂක විසින් පහත සඳහන් සංගීත භාණ්ඩ අළුත් වැඩියා කිරීම සඳහා 1964 දෙසැම්බර් මස 14 වැනි දින තෙක් මිල ගණන් භාරගනු ලැබේ:—

| | |
|---|---|
| කින්චිරා | 1 |
| දිල්රුබා | 3 |
| සිතාර් | 6 |
| දිල්රුබා බෝ | 3 |
| එස්රාජ් | 11 |
| වයලින් | 14 |
| ශ්‍රැති පෙට්ටි | 4 |
| විරිදු රබන් | 1 |
| තබ්ලා ජෝඩු | 15 |
| තාම්බුරා | 1 |
| එස්රාජ් බෝ | 15 |
| වයලින් කවර | 3 |
| වයලින් බෝ | 5 |

2. අළුත් වැඩියා කිරීමට ඇති භාණ්ඩ රත්නපුර අධ්‍යාපන කායඹාලයේ රාජකාරි කලය තුළදී පරීක්ෂා කිරීමට හැකිය.

එෆ්. එස්. විජේසූරිය,
අධ්‍යාපනාධ්‍යක්ෂක වෙනුවට.

1964 දෙසැම්බර් මස 4 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

12–168—64.12.4 දින අංක 14,247 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

